# රණවිරුවා

2020 සැප්තැම්බර් • 221 කලාපය




මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.







# "අභීතව අරමුණ කරා"

විශේෂ බලකා පාඨමාලා අංක - 50 යටතේ මාස නවයක අති දුෂ්කර පුහුණු පාඨමාලාවක් නිමකළ නිලධාරීන් 05 දෙනෙකු සහ සෙසුනිලයින් 295 දෙනෙකු ගේ විසිරයෑමේ උත්සවය ඉකුත් සැප්තැම්බර් 12 වන දින මාදුරුඔය විශේෂ බලකා පුහුණු පාසලේ දී පැවැත්විණ. මෙම විසිරයෑමේ පෙළපාලියෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය.

පාඨමාලාව සාර්ථකව අවසන් කළ සෙබළුන් වෙත පළඳවන විශේෂ බලකා ලාංඡන ගුවනින් රැගෙන එන ලද අතර, යුද්ධ හමුදාධිපතිතුමන් විසින් අදාළ සෙබළුන් වෙත එම ලාංඡන පැළඳවීම සිදුකරනු ලැබීය. ඒ සඳහා ක්‍රියාන්විත අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, 57 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ බ්‍රිගේඩියර් ඩබ්ලිව්ටීඩබ්ලිව්ජී ඉහලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ද එක්වූහ. එහිදී පාඨමාලාවේ සැම අතින්ම අතිශූර සිසුවා සහ හොඳම ශාරීරික යෝග්‍යතාවය හිමි සිසුවා ලෙස ලුතිනන් ටීඑම්ටීජීඑන්එම් තෙන්නකෝන් සහ පාඨමාලාවේ දක්ෂතම වෙඩික්කරු ලෙස ලාන්ස් කෝප්‍රල් ඒපී අළුත්ගෙදර යුද්ධ හමුදාධිපති සුරතින් කුසලාන සහ සහතිකපත් ලබාගත්හ.

# ගජබා රෙජිමේන්තුව වෙත ක්‍රීඩා පහසුකම් රැසක්...



අනුරාධපුර සාලියපුර පිහිටි ගජබා රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයට නව පුහුණු කලාපයක් සහ නවීනතම අංගෝපාංගවලින් සමන්විත පැසිපන්දු පිටියක් මෙන්ම සේනාවිධායක නිල නිවස විවෘත කිරීම ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මෙන්ම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් ඉකුත් සැප්තැම්බර් 01 වන දින සිදුවිය.



පුහුණුවීම්වල නිරතවන ගජබා රෙජිමේන්තු සාමාජිකයින් වෙනුවෙන් පහසුකම් සැපයීමට ඉදිකරනු ලැබූ ගොඩනැගිලි හතරකින් සමන්විත අංගසම්පූර්ණ නේවාසිකාගාරය ද එදින ආරාධිත අමුත්තන්ගේ සුරතින් විවෘත කෙරිණ. එහි සෑම අංශයක්ම යුද්ධ හමුදාධිපතිතුමන්ගේ අධීක්ෂණයට ලක්වූ අතර, ඉදිකිරීම වෙනුවෙන් සිය ශ්‍රම දායකත්වය ලබාදුන් හටපිරිස් සමගින් සුහද පිළිසඳරක නිරතවීමට ද හෙතෙම කටයුතු කළේය.










# නැගෙනහිර හටපිරිස් වෙත යුද්ධ හමුදාධිපතිගෙන් පැසසුම්





ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාත්මක මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් සැප්තැම්බර් 10 වන දින ත්‍රිකුණාමලයෙහි පිහිටි 22 වන සේනාංකයේ සංචාරයක නිරත විය.

ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් ජේසී ගමගේ එන්ඩීසී පීඑස්සී සමගින් 22 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උණුසුම් පිළිගැනුම මධ්‍යයේ සිදුවූ එම සංචාරයේදී නැගෙනහිර හටපිරිස් කොවිඩ් - 19 පැතිරීම පාලනය කිරීම වෙනුවෙන් සිදුකළ කාර්යභාරය යුද්ධ හමුදාධිපති ගේ ඇගයුමට ලක් විය.

# ඒකක අණදෙන නිලධාරී පාඨමාලාවෙහි ශිෂ්‍ය නිලධාරීන් හමුවී...



බුත්තල නිලධාරී ප්‍රගමන ප්‍රවර්ධන මධ්‍යස්ථානයේ අවසන් ඒකක අණදෙන නිලධාරී පාඨමාලාව හදාරණ ශිෂ්‍ය නිලධාරීන් ඔවුන්ගේ විෂය මාලාවේ තවත් එක් අංගයක් වශයෙන් ඉකුත් සැප්තැම්බර් 07 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඇතුළු ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන් හමුවී සුහද පිළිසඳරක නිරත වූහ. එහිදී යුද හමුදාවේ ඉදිරි දැක්ම පිළිබඳ පුළුල් අවබෝධයක් ශිෂ්‍ය නිලධාරීන් හට ලබාගැනීමට හැකිවිය.





# "තුරු මිතුරු - නව රටක්" ව්‍යාපෘතියෙන් මහජනයාට අතහිත



යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සංකල්පයකට අනුව දියත් කරනු ලබන "තුරු මිතුරු - නව රටක්" ව්‍යාපෘතියට සමගාමීව යුද්ධ හමුදා සාමාජිකයින් සහ යුද්ධ හමුදා කඳවුරු ආශ්‍රිතව ජීවත් වන ගොවිජනතාව තුළ ආහාර බෝග වගාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් දියත් කොට ඇත. මේ යටතේ යුද්ධ හමුදා මූලස්ථානයේ කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය කොමර්ෂල් බැංකුව සමග එක්ව මධ්‍යම පළාතේ යුද්ධ හමුදා කඳවුරු අවට වෙසෙන ගොවි ජනතාව වෙත බෙදාදීම සඳහා එළවළු බීජ මෙන්ම යන්ත්‍රෝපකරණ ඇතුළු අනෙකුත් මෙවලම් පරිත්‍යාග කිරීම සිදුකෙරිණ.

කොමර්ෂල් බැංකු කළමනාකාරිත්වයේ අනුග්‍රහය ඇතිව එම බැංකුවේ "ඔබේ ජය - අපේ පැතුමයි" යන තේමාව යටතේ පැවැති මෙම උත්සවය අතරතුරදී රුපියල් මිලියන 5 ක වටිනාකමින් යුත් භාණ්ඩ මෙලෙස ප්‍රදානය කරනු ලැබිණි. මධ්‍යම ආරක්ෂක සේනා මූලස්ථාන බලප්‍රදේශයේ පවුල් 165 ක් අතර බෙදාදීම සඳහා මෙම උපකරණ තොගය යුද්ධ හමුදා මූලස්ථානයේදී ඉකුත් සැප්තැම්බර් මස 14 වන දින ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත නිල වශයෙන් භාරදීම සිදුකෙරිණි. මෙම අවස්ථාවට කොමර්ෂල් බැංකුවේ සභාපති ධර්ම දාරසිංහ මහතා ඇතුළු බැංකු නිලධාරීන් සහ ආරාධිතයන් කිහිපදෙනෙකු සහභාගී වූහ.

# සුහද හමුවක්...





ශ්‍රී ලංකා පාකිස්ථාන මහ කොමසාරිස් කාර්යාලයේ නව ආරක්ෂක උපදේශක කර්නල් මුහම්මද් සෆ්ධාර් ඉකුත් සැප්තැම්බර් 22 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය. එහිදී දෙරටටම බලපාන වැදගත් කරුණු රැසක් පිළිබඳ සාකච්ඡා කෙරිණ. තවද ත්‍රිවිධ හමුදාව ඇතුළු සියලුම පාර්ශවකරුවන් කොවිඩ් - 19 වෛරසය වැළැක්වීම සඳහා වෙහෙස මහන්සි වී කටයුතු කිරීම පිළිබඳවද ආරක්ෂක උපදේශක සිය කෘතඥතාවය පළ කළේය.



# ඓතිහාසික දිනයක අභිමානවත් සැමරුමක්...





යුද්ධ හමුදාවේ පැරණිතම රෙජිමේන්තුවක් වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෙජිමේන්තුවේ 132 වන සංවත්සර උත්සවය දේශය වෙනුවෙන් දිවිපිදූ එම රෙජිමේන්තුවේ වීරෝදාර රණවිරුවන් අනුස්මරණය කරමින් ඉකුත් සැප්තැම්බර් මස 17 වන දින පනාගොඩ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෙජිමේන්තු මූලස්ථානයේදී අති උත්කර්ෂවත් අයුරින් පැවැත්විණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක හා ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය ඩබ්ලිව්ඩබ්ලිව්වී යූඑස්පී ගේ ආරාධනයකට අනුව මෙම සංවත්සර උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය.







# පැසසුම් මධ්‍යයේ නව තාක්‍ෂණික හඳුන්වාදීම් රැසක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා තොරතුරු තාක්‍ෂණික අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් හඳුන්වා දෙනු ලබන '**Finger Swift**- 2020' නමැති නව්‍ය තොරතුරු තාක්‍ෂණ මෘදුකාංග සංවර්ධන විසඳුම් එකතුව සහ විවිධාංගීකරණ තොරතුරු තාක්‍ෂණ යෙදුම යුද්ධ හමුදා මූලස්ථානයේදී පසුගිය සැප්තැම්බර් 07 වන දින ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉදිරියේදී හඳුන්වාදෙන ලදී. ශ්‍රී ලංකා සංඥා බළකායේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩීප්පීඑන් දෙමටන්පිටිය එන්ඩියූ පීඑස්සී ගේ මගපෙන්වීම යටතේ නවෝත්පාදන තොරතුරු තාක්‍ෂණ නව්‍යකරණ මෘදුකාංග සංවර්ධන විසඳුම්, දීප ව්‍යාප්ත ජාලකරණ පහසුකම්, නිමැවුම් සහ නවෝත්පාදන, නවීන සයිබර් ආරක්‍ෂක ප්‍රමිති ක්‍රම, දත්ත මධ්‍යස්ථාන සේවා වැනි නව්‍යකරණයන් යථාර්ථයක් බවට පත්කරගැනීමට ඉඩප්‍රස්ථාව උදාවිය. එම නවෝත්පාදනයන් සාක්‍ෂාත් කරගැනීම සඳහා ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජ්කේ තිලකරත්න පීඑස්සී සහ තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ බ්‍රිගේඩියර් පීජ්ජේ පීරිස් එන්ඩියූ සිය නොමසුරු දායකත්වය ලබාදී තිබිණ.





# උපාධිධාරී පුහුණු පාඨමාලාව යුද්ධ හමුදාධිපති ගේ ඇගයුමට...

අතිගරු ජනාධිපතිතුමන්ගේ "සෞභාග්‍යයේ දැක්ම" (Vistas of Prosperity and Splendour) සංකල්පයකට අනුව යුද්ධ හමුදා පුහුණු මධ්‍යස්ථාන 51 කදී උපාධිධාරී පුහුණු පාඨමාලාව පවත්වනු ලබයි. ඒ යටතේ පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ පවත්වනු ලබන පුහුණුවීම් ඇතුළු පරිපාලන කටයුතු පිළිබඳව නිරීක්‍ෂණය කිරීම සඳහා පසුගිය සැප්තැම්බර් 15 වන දින ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, ශ්‍රී ලංකා පාබල හමුදා සහ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයන්හි සංචාරයක නිරත විය.

අදියර පහකින් සමන්විත මෙම නායකත්ව පුහුණු වැඩසටහනේ එක් අදියරක් සඳහා උපාධිධාරීන් 10,000 ක් පුහුණු කිරීමට නියමිතය. එහි අදියර 5 ක් අවසානයේ රාජ්‍ය සේවය සඳහා බඳවාගත් උපාධිධාරීන් 50,000 ක් පුහුණු කිරීම මෙම වැඩසටහනේ අපේක්‍ෂාව වන අතර, ඉකුත් සැප්තැම්බර් 14 වන දින දිවයින පුරා ස්ථාපිත ආරක්‍ෂක සේනා මූලස්ථාන, රෙජිමේන්තු මධ්‍යස්ථාන සහ පුහුණු පාසල්හිදී මෙහි ආරම්භය සනිටුහන් කරනු ලැබිණි.

# 'ගෝඨාභය' කෘතියේ සිංහල අනුවාදය සහ 'පාතාලයෝ' කෘතීන් එළිදකී...





වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ගේ චරිතාපදානය මෙන්ම යුද්ධ හමුදා දිවිය අලළා ආරක්ෂක ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න විසින් රචිත 'ගෝඨාභය' නම් කෘතියෙහි සිංහල අනුවාදය සහ 'පාතාලයෝ' නමැති නවකතාව එළිදැක්වීමේ සමාරම්භක උත්සවය ඉකුත් සැප්තැම්බර් 06 වන දින කොළඹ ආනන්ද විද්‍යාලීය කුලරත්න ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. එම උත්සව අවස්ථාව සඳහා අතිගරු ජනාධිපතිතුමා, එම ආර්යාව, අග්‍රාමාත්‍යතුමා මෙන්ම ත්‍රිවිධ හමුදා ප්‍රධානීන් ද සහභාගී වූහ.

# වාර්ෂික මහා සභා රැස්වීමට එක්ව...






ශ්‍රී ලංකා හෝටල් පාසල් උපාධිධාරීන්ගේ සංගමයේ 49 වන වාර්ෂික මහා සභා රැස්වීම ඉකුත් සැප්තැම්බර් මස 19 වන දින සන්ධ්‍යාවේ තාජ් සමුද්‍රා හෝටලයේදී පැවැත්විණ. එහි ප්‍රධාන දේශණය සිදුකිරීම සඳහා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත ගෞරවාන්විතව ආරාධනා කර තිබුණි. සංචාරක හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් එස් හෙට්ටිආරච්චි මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එක්වූ එම අවස්ථාව හෝටල් ක්ෂේත්‍රය හා සම්බන්ධ විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් පැවැත්විණ.

# මාලදිවයින් මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක යුද්ධ හමුදාධිපති හමුවෙයි......





මාලදිවයින් මහකොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක ලුතිනන් කමාන්ඩර් ඉස්මයිල් නසර් ඉකුත් සැප්තැම්බර් 21 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාත්මක මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය. යුද්ධ හමුදාධිපති කාර්යාලයේ පැවැති මෙම සුහද හමුව අවසානයේ අන්‍යෝන්‍ය සුහදත්වය සහ ද්විපාර්ශ්වීය අවබෝධය සංකේතවත් කරමින් සමරු තිළිණ හුවමාරුවක්ද සිදුකෙරිණ.

## ලෝක සංචාරක දිනයට යුද්ධ හමුදාධිපතිගෙන් දෙසුමක්...

එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක දින නිල සැමරුමට සමගාමීව වෙළඳ හා සංචාරක දෙපාර්තමේන්තුව, මධ්‍යම පළාත් උපායමාර්ගික සංගමය සහ සංචාරක හා ගුවන් සේවා අමාත්‍යංශය සමග එක්ව අඛණ්ඩව 7 වන වරටත් පවත්වනු ලබන ජාත්‍යන්තර සංචාරක නායකයින්ගේ සමුළුව සහ සංචාරක පර්යේෂණ සම්මන්ත්‍රණය ඉකුත් සැප්තැම්බර් 27 දින මහනුවර **Kandy City Center** පරිශ්‍රයේදී පැවැත්විණි. එහි ප්‍රධාන දේශණය ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාත්මක මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් සිදු කළේය.













# ජයග්‍රහණය හා සාමය...

2 වන ලෝක යුද්ධයට වසර 75 ක් සපිරීම නිමිත්තෙන් ඉකුත් සැප්තැම්බර් 21 දින කොළඹ රුසියානු මධ්‍යස්ථානයේදී ජයග්‍රහණය සහ සාමය (**Victory and Peace**) තේමාව යටතේ පැවති චිත්‍ර ප්‍රදර්ශනයේ සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය. කොළඹ රුසියානු මධ්‍යස්ථානයේ පිහිටි රුසියානු කලා පාසල විසින් සංවිධානය කරන ලද මෙම චිත්‍ර ප්‍රදර්ශනය එම සිසු සිසුවියන්ගේ දක්‍ෂතා දැකගනු වස් 2020 සැප්තැම්බර් මස 21 දින සිට 30 දින දක්වා සතියක කාලයක් මහජනතාව වෙනුවෙන් විවෘත විය.

# යුද්ධ හමුදා රෝහලට බෝවන රෝග අණුක විනිශ්චය රසායනාගාරයක්...









ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා කොවිඩ් - 19 වෛරසය ආසාදනය වී තිබේදැයි යන්න නිශ්චිතව පරීක්ෂා කරගැනීම සඳහා එක් වරකදී **PCR** පරීක්ෂණ 300 ක් පමණ සිදු කිරීමේ හැකියාව සහිතව අංගසම්පූර්ණ ස්වයංක්‍රීය බෝවන රෝග අණුක විනිශ්චය රසායනාගාරයක් සැප්තැම්බර් 08 දින කොළඹ යුද්ධ හමුදා රෝහලේදී විවෘත කෙරිණ. මෙම නව ඒකකය ස්ථාපිත කිරීම තුළින් **PCR** පරීක්ෂණ සහ බෝවන රෝග සඳහා පරීක්ෂණ පැවැත්වීමට රජය ගෙනයන වැඩපිළිවෙලට සක්‍රියව දායකවීමේ හැකියාව ඇත. වර්තමානයේදී, විද්‍යාත්මක වෛරස අධ්‍යයන උපදේශකයන් හා ක්ෂුද්‍රජීව විද්‍යාඥයින්ගේ සමීප අධීක්ෂණය යටතේ දිවයින පුරා නම් කරන ලද රසායනාගාර 20 ක කොවිඩ් - 19 වෛරස් වසංගතයට එරෙහිව එම රෝග විනිශ්චයන් සඳහා **PCR** පරීක්ෂණ කටයුතු සිදුකරනු ලබයි. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාලයේ කාර්ය නියුතු සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් බ්‍රිගේඩියර් පීජ්සී ප්‍රනාන්දු යූඑස්පී විසින් කරන ලද ආරාධනාවකට අනුව මෙම අවස්ථාව වෙනුවෙන් ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එක්විය. මෙම නව රසායනාගාරය පිහිටුවීම වෙනුවෙන් සම්පත් බැංකුව, **WSO2 LANKA** පුද්ගලික සමාගම සහ සිලෝන් බිස්කට් ආයතනය එක්ව රුපියල් මිලියන 30 ක මූල්‍ය පරිත්‍යාගයක්ද ලබාදී තිබිණ.



# කෙළිබිම දිනන්නට තෝතැන්නක්...





හෙරලියාවල ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු මූලස්ථාන බළඇණි පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකළ ක්‍රීඩාංගණය පසුගිය සැප්තැම්බර් 18 වන දින යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී හා ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එච්ආර්එන් ප්‍රනාන්දු ආර්එස්පී එන්ඩීසී ගේ ආරාධනයෙන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් විවෘත කෙරිණ.

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ ක්‍රීඩා කොෂලතා ඉහළ නැංවීමේ අරමුණින් ඉදිකළ මෙම ක්‍රීඩා පිටියේ පහසුකම් හමුදාවට මෙන්ම අවට පාසල්වල ක්‍රීඩක ක්‍රීඩිකාවන්වද හිමිවනු ඇත.







# සොඳුරු දිනයක මතක සටහන්...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකා සේවා වනිතා ශාඛාවේ 2020 වර්ෂයේ වාර්ෂික මහසභා රැස්වීම හා සුහද හමුව ඉකුත් සැප්තැම්බර් 06 දින සිනමන් ලේක් හෝටලයේදී පැවැත්විණ.

මෙම සුහද හමුවේ ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු ශාඛාවේ ගරු සභාපතිනිය ප්‍රියදර්ශනී සිරිනාග මහත්මියගේ ආරාධනයෙන් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය සහභාගී වූවාය.





# මිහිඳු සෙත් මැදුරේ සංචාරයක්...

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනියගේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ ප්‍රවීණ රූපලාවන්‍ය ශිල්පී ධනංජය බංඩාර මහතාගේ අදහසකට අනුව ඔහුගේ උපන්දින සාදය ඉකුත් සැප්තැම්බර් 11 වන දින මිහිඳු සෙත් මැදුරේ නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන් සමඟ එක්ව සමරන ලදී. ධනංජය බංඩාර මහතා ඇතුළු ඔහුගේ පවුලේ ඥාතීන්, කලා ක්ෂේත්‍රයේ ජනප්‍රිය නළු නිළියන් හා ගායක ගායිකාවන් රැසකගේ සහභාගීත්වයෙන් අති උත්කර්ෂවත් අන්දමින් එය පැවැත්විණ.





# බේකරි නිෂ්පාදනය පිළිබඳ පාඨමාලාවක්...

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනියගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ ප්‍රීමා බේකරි නිෂ්පාදන පුහුණු ආයතනය වෙතින් සේවයේ නියුතු යුද්ධ හමුදා රණවිරුවන් වෙනුවෙන් බේකරි නිෂ්පාදන පිළිබඳ ලබාදෙනු ලබන තෙදින පාඨමාලාවේ සමාරම්භය ඉකුත් සැප්තැම්බර් 11 වන දින රාජගිරියේ පිහිටි එම පුහුණු ආයතනයේදී සිදුකරන ලදී.





# දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක්...

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ මූලිකත්වයෙන් සෙනෙහස අධ්‍යාපන සම්පත් පර්යේෂණ හා තොරතුරු කේන්ද්‍ර මගින් සිදුකරනු ලබන කාර්යයන් හා සේවාවන් පිළිබඳ යුද්ධ හමුදා රෙජිමේන්තු දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 09 වන දින සෝනියා කෝට්ටේගොඩ මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම කේන්ද්‍ර ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

යුද්ධ හමුදා නිලධාරී/සෙසුනිලයින්ගේ විශේෂ අවශ්‍යතා ඇති දූ දරුවන් වෙනුවෙන් සිදුකරනු ලබන වෛද්‍ය ප්‍රතිකාර සහ මූලික අධ්‍යාපන අවශ්‍යතා මෙම මධ්‍යස්ථානය වෙතින් ලබාදෙන අයුරු සෙනෙහස අධ්‍යාපන සම්පත් පර්යේෂණ හා තොරතුරු කේන්ද්‍ර සේනාධිනායක බ්‍රිගේඩියර් එම්ජ්ආර් ගුණසේකර ආර්එස්පී විසින් පැමිණ සිටි අයවලුන් දැනුවත් කරන ලදී. තවද මෙම කේන්ද්‍රස්ථානය ඉකුත් ඔක්තෝබර් මස 01 වන දින සිට නව මුහුණුවරකින් යුද, ගුවන්, නාවික, පොලිස් සහ සිවිල් ආරක්ෂක අංශයද සමගින් ආරක්ෂක අංශයේ සියලුම දෙනා ඇතුළත් වන පරිදි ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා ඇති දරුවන් වෙනුවෙන් අධ්‍යාපන, වෛද්‍ය ප්‍රතිකාර හා රැකවරණය ලබාදීමට සූදානම්ව සිටී.

# සන්නාහ සන්නද්ධ බළකා සේවා වනිතා ශාඛාව...



ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි පියුමාලි තිලකරත්න මහත්මියගේ සහභාගීත්වයෙන් 5 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකායේ රාජකාරියේ නියුතු සෙසුනිලයින්ගේ පවුල්වල ඥාතීන්ගේ ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමේ සුහද හමුවක් පසුගියදා පාන්ගොල්ල ශුද්ධ හමුදා කඳවුරේදී පවත්වන ලදී.

# ඉංජිනේරු බළකා සේවා වනිතා ශාඛාව..



ඉංජිනේරු බළකායට අයත් ක්‍රියාන්විත හේතුන් මත මියගිය/ආබාධිත රණවිරු දරුදැරියන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු සාර්ථක කරගැනීම සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ සහ වෛද්‍යාධාර ලබාදීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 20 වන දින ශ්‍රී ලංකා ඉංජිනේරු බළකා රෙජිමේන්තුවේදී පවත්වන ලදී. එම බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනියගේ මගපෙන්වීම යටතේ පරිත්‍යාගශීලීන් විසින් ලබාදුන් ආධාර මත දූ දරුවන් 08 දෙනෙකු සඳහා එහිදී අදාළ ශිෂ්‍යත්ව පිරිනැමිණ.

# ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාව...



දඹුල්ල, තලකිරියාගම පදිංචි සෙ/32989 කෝප්‍රල් දසනායක ආර්ඩීඑච්ඩීඑස් යන ආබාධිත කොනොනි වෙත නව නිවසක් ඉදිකර දීමට පාබල හමුදා සේවා වනිතා ශාඛාව ක්‍රියාකරන ලදී. 5(සේවා) ශ්‍රී ලංකා පාබල හමුදා ඒකකයේ සහ එම රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ භට පිරිස්හි දායකත්වයෙන් මෙම නිවස ඉදිකරන ලදී. ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේජේ ජයවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් ගේ මගපෙන්වීම යටතේ එම සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනිය අනූජා ජයවීර මහත්මියගේ උපදෙස් මත මෙය ක්‍රියාත්මක විය.

# ඉංජිනේරු සේවා බළකා සේවා වනිතා ශාඛාව...

4(සේවි) ඉංජිනේරු සේවා බළකාය යටතේ රාජකාරී කරනු ලබන සෙ/එස්101507 ඉසෙ ඒකනායක ඊඑම්එන්කේ යන සෙනිගේ ආබාධිත දරුවා හට රෝද පුටුවක් මිලදී ගැනීම සඳහා එම සේවා බළකා සේවා වනිතා ගරු සභාපතිනියගේ උපදෙස් පරිදි රුපියල් 45,000.00 ක මුදලක් ලබාදෙන ලදී. ඒ අනුව මිලදීගත් රෝද පුටුව තත් සෙනියා වෙත භාරදීම 9 (සේවි) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී සහ එම මැතිණිය වන එස්සීකේ සේනාරත්න මහත්මියගේ සුරතින් පසුගියදා සිදු කෙරිණ.



# විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව...



විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය අවන්ති පිලපිටිය මහත්මිය ප්‍රමුඛ සේවා වනිතා සාමාජිකාවන් ඉකුත් සැප්තැම්බර් 05 වන දින අභිමංසල 111 පාන්ගොල්ල හි නේවාසික රණවිරුවන්ගේ සුවදුක් සොයා බැලීම සඳහා සංචාරයක නිරතවිය. එහිදී ඔවුන්ගේ අවශ්‍යතාවයන්ට අනුව භාණ්ඩ පරිත්‍යාග කිරීමටද කටයුතු කෙරිණ.

# පුරෝගාමී බළකා සේවා වනිතා ශාඛාව...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බළකා සේවා වනිතා ශාඛාව මගින් 03 වන විශේෂ බළකායට අයත් සෙ/415743 මා/සැරයන් කුමාර ඩබලිව් ආර්එස්පී යන ජේෂ්ඨකොනොනිගේ බිරිඳ හා රෝගී දරුවා වෙනුවෙන් මෙන්ම සෙ/1පී05242 කෝප්‍රල් පුෂ්ප කුමාර පීකේආර් යන කොනොනි ගේ දරුවන්ගේ ඉදිරි කටයුතු සඳහා මුදල් පරිත්‍යාගයක් ලබාදෙන ලදී. පුරෝගාමී බළකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි රමණී තිලකලතා ජයසූරිය මහත්මියගේ සුරතින් එම පරිත්‍යාග ලබාදීම සිදුවූවාය.







# හිසට සෙවණක්...

යුද්ධ හමුදාව මැදිහත්ව සිදුකරන නිවාස ඉදිකර පරිත්‍යාග කිරීමේ වැඩසටහනෙහි තවත් එක් අධියරක් ලෙස වාමදේව ත්‍යාගේන්ද්‍රන් මහතාගේ මූල්‍ය දායකත්වයෙන් පුංකුඩුතිව් ප්‍රදේශයේ පදිංචි අඩු ආදායම්ලාභී කාන්තාවක් වන තවරාසා කවිදා මහත්මිය වෙනුවෙන් ඉදිකළ නව නිවස ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑච්ඒ සෙනරත් බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් පසුගියදා පිරිනැමිණ.




# "HARMONY FOOTBALL TOURNAMENT - 2020"

යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑච්ඒ සෙනරත් බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සංකල්පයකට අනුව 51 වන සේනාංක මූලස්ථානයේ අධීක්ෂණයෙන් හා 513 වන බලසේනා මූලස්ථානය මගින් සංවිධානය කළ **"HARMONY FOOTBALL TOURNAMENT - 2020"** පාපන්දු තරගාවලියේ අවසන් මහා තරගය යාපනය අරියාලේ එක්සත් ක්‍රීඩාංගණයේදී ඉකුත් සැප්තැම්බර් මස 19 වන දින සාර්ථක ලෙස නිමාවට පත්විය. යාපනය ප්‍රදේශයේ දමිළ තරුණයින් සහ යුද්ධ හමුදාව අතර මිත්‍රත්වය වර්ධනය කිරීමත් ඔවුන්ගේ ක්‍රීඩා කොෂලය ඔප්නංවමින් ජාතික සහ ජාත්‍යන්තර තලයට ඔසවා තැබීමත් අරමුණු කර ගනිමින් ගුරුනගර්, නාවන්තුරේ, පණ්ඩතිරිප්පු, පෙරියවිලාන්, ඉලවාලේ සහ පලාලි ප්‍රදේශවල ක්‍රීඩා සමාජවලට අයත් පාපන්දු කණ්ඩායම් 12 ක සහභාගීත්වයෙන් මෙම තරගාවලිය සංවිධානය කර තිබිණ. අවසන් මහා තරගය සඳහා ගුරුනගර් සිගින් ෆිෂ් කණ්ඩායම සහ නාවන්තුරේ සෙන්ට් නිකලස් ක්‍රීඩා සමාජ දෙක සුදුසුකම් ලැබූ අතර, එහිදී ගෝල 2 - 1 ක් ලෙස ගුරුනගර් සිගින් ෆිෂ් ක්‍රීඩා සමාජ පාපන්දු කණ්ඩායම විසින් ශුරතාවය හිමිකර ගන්නා ලදී.



# සංග්‍රාමික පා පැදි පුහුණු පාඨමාලාවක්...

62 වන සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එස්එම්එස්පීබී සමරකෝන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ සංකල්පයක් මත වන්නි බල ප්‍රදේශයේ ආරක්ෂාව තහවුරු කිරීමේ අරමුණින් සංග්‍රාමික පාපැදි පාඨමාලාවක් 62 වන සේනාංක මූලස්ථානය වෙතින් සිදුකරන ලදී. ඒ සඳහා 11 වන ගැමුණු හේවා බළඇණිය, 9 වන ගජබා රෙජිමේන්තුව, 20 වන ගජබා රෙජිමේන්තුව, 14(සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව හා 17 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව යන ඒකකයන්ගෙන් තෝරාගත් 35 දෙනෙකුගෙන් සමන්විත භට පිරිසක් සහභාගි වූහ. 2 වන විශේෂ බළකා උපදේශක මඩුල්ලක් විසින් දින 15 ක් පුරා 622 වන බලසේනා මූලස්ථානය යටතේ මෙම පුහුණුවීම් සිදුකරන ලදී. පුහුණුව ලැබූවන්ගේ විසිරයාමේ උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ජේඑම්යූඩී ජයසිංහ සහභාගි විය.



# සංචාරයක මතක සටහන්...

ආරක්ෂක සේනා (වන්නි) බල ප්‍රදේශයේ උපාධිධාරීන් පුහුණු කිරීම සඳහා තෝරාගෙන ඇති යුද්ධ හමුදා පුහුණු පාසල්හි අඩුපාඩු සොයා බැලීම සඳහා ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ජේඑම්යූඩී ජයසිංහ විසින් ඉකුත් සැප්තැම්බර් 14 වන දින සංචාරයක් සිදුකරන ලදී. මෙහිදී උපාධිධාරීන් 2550 දෙනෙකු භට නායකත්ව පුහුණු පාඨමාලාව දින 21 ක කාලසීමාවක් සිදුකිරීම සඳහා ආරක්ෂක සේනා (වන්නි) බල ප්‍රදේශයේ තෝරාගත් පුහුණු පාසල් 12 ක සියලු කටයුතු සූදානම් කර ඇත.







# නිරීක්ෂණ සංචාරයක නිරත වෙමින්...

ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් ජේසී ගමගේ එන්ඩීසී පීඑස්සී ඉකුත් සැප්තැම්බර් 18 වන දින ඉදිරි නඩත්තු පෙදෙස නැගෙනහිර සංචාරයක නිරත විය. එහිදී ඉදිරි නඩත්තු පෙදෙස නැගෙනහිර ආඥාපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඒ ආරියරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබීය. මෙම සංචාරය තුළදී ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති එම ප්‍රදේශයේ සැපයුම් හා සේවා පිළිබඳ සොයාබලන ලද අතර, එම මූලස්ථානය යටතේ ඇති නිරෝධායන මධ්‍යස්ථාන සහ එහි මෙහෙයුම් කටයුතු, ඉංජිනේරු සේවා බළකායේ අඛණ්ඩ ඉදිකිරීම් කටයුතු, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකාය විසින් සිදුකරනු ලබන වාහන නඩත්තු කටයුතු ආදිය පිළිබඳවත් එහිදී විශේෂ අවධානය යොමුකරන ලදී.

# කෙඩෙට් නිලධාරීන් කිළිනොච්චි, මුලතිව් සංචාරයක...

දියතලාව යුද්ධ හමුදා විද්‍යා පීඨයේ පුහුණුව ලබන පාඨමාලා අංක 88 හි කෙඩෙට් නිලධාරීන් 46 දෙනෙකු ඉකුත් සැප්තැම්බර් 03 සහ 04 යන දෙදින ආරක්‍ෂක සේනා මූලස්ථානය කිළිනොච්චි හා මුලතිව්හි සංචාරයක නිරත වූහ.

එම ප්‍රදේශවල ඉතිහාස තොරතුරු, පැවති යුධමය තත්ත්වය සේම වත්මන් ආරක්‍ෂක කටයුතු ආදිය පිළිබඳ එහිදී ඔවුනට අවබෝධයක් ලබාදීමට කටයුතු කෙරිණ.



කිළිනොච්චිය...



සංචාරය සනිටුහන් කරනු වස් ආරක්‍ෂක සේනා (කිළිනොච්චි) ආඥාපති මේජර් ජෙනරාල් ක්ලවුන්ස් කොඩුවේගොඩ එන්ඩීසී අයිජී වෙත සමරු සිහිවටනයක් පිළිගන්වමින්



කෙඩෙට් නිලධාරීන් ඇතුළු පිරිස අලිමංකඩ ගාමිණී කුලරත්න ස්මාරකය අභියසදී



## මුලතිව්



සංචාරය සිහිවීම වස් ආරක්‍ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ආර්එම්පීජේ රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී වෙත සමරු සිහිවටනයක් පිළිගන්වමින්...



සංචාරය සිහිවීම වස් මුලතිව් ආරක්‍ෂක සේනා ආඥාපති සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටිමින්...



## සෙබළියන්ට අතහිත...

ආරක්‍ෂක සේනා (බටහිර) සිවිල් සම්බන්ධීකරණ නිලධාරී කර්නල් එන් මහවිතාන ගේ සම්බන්ධීකරණයෙන් 306-1සී සිංහ දිස්ත්‍රික්කය වෙතින් සිදුකරනු ලබන සමාජ සත්කාරක ව්‍යාපෘති යටතේ යුද්ධ හමුදා කාන්තා සෙබළියන් තිදෙනෙකුගේ දෙමාපියන් හට අවැසි රෝද පුටුවක්, ඇස් කාචයක් හා උපැස් යුවලක් පරිත්‍යාග කිරීම ආරක්‍ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් බීවීඩීපී අබේනායක යූඑස්පී එන්ඩියූ අතින් ඉකුත් සැප්තැම්බර් 17 වන දින සිදුවිය. තවද සිංහ අක්ෂි රෝහල - හැඳල වෙතින්ම අක්ෂි සැත්කම සිදුකර ඒ සඳහා ලබාදෙනු ලබන සියලු ප්‍රතිකාර සහ ඖෂධ නොමිලේ ලබාදීමටද කටයුතු කරන ලදී.



## නිසට සෙවණක්...

ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්තවාදීන් විසින් එල්ල කළ මෝටාර් ප්‍රහාරයකින් දෙඇස්වලට බරපතල තුවාල සිදුවී දෙනෙත් අඳව රණවිරුවකු වූ දැනට වෛද්‍ය හේතූන් මත විශ්‍රාමලත් 6 වන ගැමුණු හේවා බළඇණියේ සෙ/414564 වර්ණ සැරයන් උදයංග පීඑම්සී හට නිවසක් පරිත්‍යාග කිරීම ඉකුත් සැප්තැම්බර් 24 දින සිදුවිය. තත් ජ්‍යෙෂ්ඨ කොනොහි හට පදිංචිය සඳහා ස්ථිර නිවහනක් නොමැතිකම හේතුවෙන් නවසීලන්තයේ ශ්‍රී ලංකා සේවා මුක්ත හට සංගමයේ ධන පරිත්‍යාගයෙන් ලුතිතන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව භාර අරමුදලෙන් සහ ගැමුණු හේවා බළඇණියේ ශ්‍රම දායකත්වයෙන් මිලියන 1.6 ක් වැයකර ඉදිකෙරුණු මෙම නිවස විවෘත කිරීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස ලුතිතන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව භාර අරමුදලෙහි ගරු සභාපතිනි ලිලී කොබ්බෑකඩුව මහත්මිය සහභාගී වූවාය. තවද ශ්‍රී ලංකා යුද්ධ හමුදා විශ්‍රාමික කර්නල් සුනිල් පීරිස්, ආරක්‍ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් බීවීඩීපී අබේනායක යූඑස්පී එන්ඩියූ සහ ගැමුණු හේවා බළකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය අවන්ති අබේනායක මහත්මියද ඊට එක්වූහ.



## සිරසෙන් සිරසට සෙවණක්...

සිරස ගුවන්විදුලි නාලිකාවේ 25 වන සංවත්සරයට සමගාමීව "සිරස නිවස" වැඩසටහන යටතේ ආරක්ෂක සේනා (මධ්‍යම) බල ප්‍රදේශයේ පිහිටා ඇති බුත්තල යුධගහාව ප්‍රදේශයේ තෝරාගන්නා ලද දිළිඳු පවුලක් වෙත යුද්ධ හමුදා ශ්‍රම දායකත්වයෙන් ඉදිකළ නිවසක් ඉකුත් සැප්තැම්බර් 12 වන දින සුබ මොහොතින් නිවාසලාභී පවුලේ අයිතියට පත්කරන ලදී.

එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී, සිරස මාධ්‍ය ජාලයේ මාධ්‍ය ප්‍රධානී සමූහ අධ්‍යක්ෂිකා නිදා වීරසිංහ මහත්මිය, 12 වන පාබල සේනාංකාධිපති ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ප්‍රදේශවාසීහු රැසක් සහභාගී වූහ.



## නිරීක්ෂණ චාරිකාවක...

"සෞභාග්‍යයේ දැක්ම" සංකල්පයට අනුව යුද්ධ හමුදාවේ මූලිකත්වයෙන් උපාධිධාරීන් 50000 ක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වෙන ආරක්ෂක සේනා (මධ්‍යම) යටතේ පාලනය වන පුහුණු පාසල්හි පහසුකම් සහ පවතින වත්මන් තත්වය පිළිබඳ සොයාබැලීම සඳහා ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී ඉකුත් සැප්තැම්බර් 08, 09 සහ 10 යන තෙදින සංචාරයක නිරතවන ලදී.



# යුද්ධ හමුදා සූපවේදී බළඇණිය

2016 වර්ෂයේ යුද්ධ හමුදා මූලස්ථානය වෙතින් අනුමත කරන ලද නිලධාරී 15 දෙනෙකු සහ සෙසු නිලයින් 413 දෙනෙකුගෙන් සමන්විත සංස්ථාවකට අනුව ආරම්භ කර ඇති යුද්ධ හමුදා සූපවේදී බළඇණිය මේ වන විට නිලධාරීන් 08 දෙනෙකු සහ සූපවේදී ක්ෂේත්‍රයේ පුහුණුව ලැබූ සෙසුනිලයින් 182 දෙනෙකුගෙන් සමන්විතය. එය සමස්ත යුද්ධ හමුදාවේ සූපවේදී කාර්යයන් සඳහා උපදේශකත්වය ලබාදෙමින් සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ඉදිරාම යුද්ධ හමුදාධිපති තුමන්ගේ උපදෙස් මත ක්‍රියා කරන බළඇණියක් ලෙස කටයුතු සිදු කරනු ලබයි.















බළඇණිය පිහිටුවා වසර 5 කට ආසන්න කාල පරිච්ඡේදය තුළ විශාල ප්‍රගතියක් ලබා ඇති මෙම බළඇණියේ රාජකාරියේ නියුතු සූපවේදී සෙනින් තරු පංති හෝටල්වල සිටින ප්‍රවීණ සූපවේදීන් හා ජාතික නිපුණතා මට්ටමේ සූපවේදීන්ට සමාන දක්ෂතා ඇති සූපවේදී සෙනින් වේ. දැනට රටේ ඕනෑම ස්ථානයක ඇතිවන ආපදා අවස්ථාවක ආපදාවන්ට ලක්වන වැසියන් සඳහා අවශ්‍ය ආහාරපාන ලබාදීම සඳහා නිපුණත්වයක් ඇති කණ්ඩායමකින් සමන්විත බළඇණියක් ලෙස මේ වන විට පහත සඳහන් විශේෂ සූපවේදී රාජකාරීන් ද සිදුකරනු ලබයි. ඊට අමතරව ඉතා කෙටි කාලයක් තුළදී දේශීය මෙන්ම විදේශීය සූපවේදී තරගාවලි සඳහා සහභාගී වී විශිෂ්ට ජයග්‍රහණ ලබාගෙන සමස්ත යුද්ධ හමුදාව වෙත කීර්තිනාමයක් අත්කරදීමට මෙම බළඇණියේ සාමාජිකයින් සමත්ව ඇත.

- හදිසි ආපදා වලදී අවතැන්වූවන් සඳහා ආහාර පිසීම ( 1000 සිට 25000 දක්වා).
- දෙස් විදෙස් ප්‍රභූවරුන් වෙනුවෙන් පවත්වන තේ පැන් සංග්‍රහයන් සිදු කිරීම.
- විශේෂිත උත්සව අවස්ථාවන් සඳහා ආහාරපාන පිළියෙල කර ලබාදීම.
- දෙස් විදෙස් ප්‍රභූවරුන් වෙනුවෙන් පවත්වනු ලබන දිවා/රාත්‍රී භෝජන සංග්‍රහයන් හි ආහාරපාන පිළිගැන්වීමේ කටයුතු.
- විශේෂ උත්සව අවස්ථාවන් සඳහා **Bar tender** වෘත්තිකයන්ගේ සහය ලබාදීම සහ **Bar tender** වෘත්තියේ නියැලෙන්නන් පුහුණු කිරීම (**Cocktalier** ).
- උත්සව අවස්ථාවන්හි අලංකරණ කටයුතු සඳහා එළවළු, පලතුරු, අයිස් කැටයම් නිර්මාණය කිරීම සහ පුහුණුව ලබාදීම **(Vegetable/Fruits/Ice Carving)**.
- උත්සව අවස්ථාවන් සඳහා අවශ්‍ය සියළු පේස්ට්‍රි, කේක්, බේකරි නිෂ්පාදනයන් සිදු කිරීම හා ඒ පිළිබඳව පුහුණුව ලබාදීම .
- සූපවේදී සංස්කරණ පාඨමාලා සහ භෝජනාගාර සහායක පාඨමාලා පැවැත්වීම.
- කොආවිච් රෝහලේ ආහාරපාන පිසීමේ කටයුතු සිදු කිරීම.
- නිරෝධායන මධ්‍යස්ථාන වෙත ආහාර පිළියෙල කර ලබාදීම.



# 56 වන සේනාංකයට අභිමානවත් වසර 23 ක්...





56 වන සේනාංකයට වසර 23 ක් සපිරීම නිමිත්තෙන් සංවිධානය කෙරුණු ක්‍රීඩා තරගාවලියක් ඉකුත් සැප්තැම්බර් 25 වන දින එම සේනාංක ක්‍රීඩාපිටියේදී පැවැත්විණ. සේනාංකය යටතේ රාජකාරීන්හි නියුතු බලසේනා, ඒකක හා පුහුණු පාසල්වල සහභාගීත්වයෙන් පැවති ක්‍රීඩා තරගාවලියට වොලිබෝල් , ක්‍රිකට් හා පාපන්දු තරග ඉසව් ඇතුළත් විය. එහිදී වොලිබෝල් හා ක්‍රිකට් කණ්ඩායම්වල ජය 15 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවටද පාපන්දු ජය 21 (සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවටද හිමිවිය. තරගාවලියේ ජය සංකේත ප්‍රදානය 56 වන සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඩබ්ලිව්ආර් ද ආබෲ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණ.




## අන්තර් ඒකක ජයග්‍රහණ රැසක්...

13 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව 2020 වර්ෂයේදී එම රෙජිමේන්තුව මගින් සංවිධානය කරන ලද අන්තර් ඒකක ක්‍රීඩා තරගාවලිය සඳහා සහභාගී වී අත්පන්දු, ජූඩෝ, පාපන්දු හා මැරතන් තරගවලින් ජයග්‍රහණ රැසක් හිමිකරගන්නා ලදී.



අන්තර් ඒකක අත්පන්දු තරගාවලියේ ප්‍රථම ස්ථානය දිනාගත් කණ්ඩායම.

# කොරෝනා වසංගතයට එරෙහි දෙවන මානුෂීය මෙහෙයුම

ලොව පුරා මිනිස් ජීවිත අකාලයේ අහිමි කළ කොරෝනා වසංගතය ලොව දියුණු යැයි සම්මත ප්‍රබල රාජ්‍යයන් පවා නොසිතූ පරිදි අසීරුතාවයන්ට පත් කරන ලදී. ඇමෙරිකාව, ඉතාලිය, එක්සත් රාජධානිය, ප්‍රංශය වැනි රටවල් මළමිනී පිරුණු අමුසොහොන් බවට පත් වෙද්දී කුඩා රටක් ලෙස එය සාර්ථකව පාලනය කිරීමට ශ්‍රී ලංකාවේ ආරක්ෂක අංශ, සෞඛ්‍ය අංශ සමඟ එක්ව කටයුතු කරමින් මුළු මහත් ලෝකයාටම නව්‍ය ආරක්ෂණ සැලැස්මක් හඳුන්වා දෙනු ලැබීය.

කොරෝනා වසංගතය මැඩලීමට යුද්ධ හමුදාව මැදිහත්වී ඇත්තේ කුමන පදනමක් මතදැයි හමුදාධිපතිතුමන් විසින් මාධ්‍ය ප්‍රකාශ නිකුත් කරන්නේ මන්දැයි මෑතකදී ඇතැම් පාර්ශවයන් විසින් ප්‍රශ්න කරනු දක්නට ලැබුණි. එබැවින් මෙම කර්තව්‍යයේ නීත්‍යානුකූලභාවය පිළිබඳව යුද්ධ හමුදා සාමාජිකයින් වශයෙන් අවබෝධයක් ලබාගැනීම කාලීනව වැදගත් අවශ්‍යතාවයකි.

රටේ ජනාධිපතිතුමන් සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා බව මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 වන වගන්තිය ප්‍රකාරව අනාවරණය කරන අතර, හදිසි අවස්ථාවකදී හෝ අත්‍යාවශ්‍ය මොහොතකදී ජන ජීවිතයට අත්‍යාවශ්‍ය ප්‍රධමය නොවන සේවා හා සැපයුම් පවත්වාගෙන යාම වෙනුවෙන් සිවිල් සේවාවන් පවත්වාගෙන යාමට ත්‍රිවිධ හමුදාවන් කැඳවීමට රටේ ජනපතිවරයාට යුධ, නාවුක හා ගුවන් හමුදා පනත් ප්‍රකාරව බලය හිමිවිය.

1949 අංක 17 දරණ යුධ හමුදා පනතේ 19(1) (ආ) හා 23 යන වගන්ති එක්ව කියවීමෙන් මෙම බලය රටේ ජනාධිපතිතුමන් වෙත හිමිවන බව මනාව පැහැදිලි වේ. මීට සමාන නෛතික විග්‍රහයක් 1949 අංක 41 දරණ ගුවන් හමුදා පනතේ 19 හා 23A වගන්ති එක්ව කියවීමෙන්ද 1950 අංක 34 දරණ නාවික හමුදා පනතේ 16 හා 21 වගන්ති එක්ව කියවීමෙන්ද විග්‍රහ කරනු ලබයි.

තවද රටේ ආරක්ෂාව යනු ප්‍රධමය වශයෙන් ජාතියකට එල්ලවන තර්ජනයක් වශයෙන් පුළුකොට සැලකිය හැකි කරුණක් නොවේ. එය මෙතෙක් කිසිදු නීතියක් මගින් අර්ථනිරූපණයකට ලක්වී නොමැති නමුත් එය ඉතා පුළුල්ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය ප්‍රකාරව අර්ථනිරූපණයට ලක්විය යුත්තකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකීයභාවය, නිදහස, ස්වෛරීභාවය, ස්වාධීනභාවය, ප්‍රජාතාන්ත්‍රිකභාවය, සමාජවාදීභාවය, පරමාධිපත්‍ය, භෞමික අඛණ්ඩතාවය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ඊට අනුකූලව නීත්‍යානුකූලව හඳුනාගත් නීතීන්ද ආරක්ෂා වන පරිදි මහජනතාවට හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දේශසීමාවන් තුළට නීත්‍යානුකූලව ඇතුළුවූ විදේශිකයින්ටද සාමකාමී හා නිදහසේ ඔහයෙන්, සැකයෙන් හා පීඩනයෙන් තොරව ජීවත්වීම උදෙසා සුරක්ෂිත කොට තහවුරු කිරීම ජාතික ආරක්ෂාව යනුවෙන් අර්ථනිරූපණය කළ හැකිය.

පොලිස් රාජකාරී ක්‍රියාත්මක කරමින් නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ රාජකාරිවලට පවා හමුදාවන්හි සහයෝගය ලබාගැනීම මෙන්ම එවැනි රාජකාරී සඳහා හමුදාවන්ගේ මැදිහත්වීම රටේ අපරාධ නීතියෙන් පවා පිළිගෙන ඇති බව නිරීක්ෂණය වන අවස්ථාද දක්නට ලැබේ. නිදර්ශනයක් ලෙස 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 95(3), 96, 97(2)(අ) සහ 97(2)(ආ) යන වගන්ති මගින් නීතිවිරෝධී රැස්වීම් විසුරුවා හැරීම සම්බන්ධයෙන් ත්‍රිවිධ හමුදාවන් කැඳවීම, ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ සේවය ලබාගැනීම, මහජන ආරක්ෂාවට බරපතල තර්ජනයක් වන එවැනි අවස්ථාවකදී හමුදාවක වගකීම හා මැදිහත්වීමේ ක්‍රියාපිළිවෙත සම්බන්ධයෙන් විධිවිධානද, එවැනි ක්‍රියාවකදී සද්භාවයෙන් ක්‍රියාකරන හමුදා සාමාජිකයින්ට නීතියෙන් පවතින රැකවරණය පිළිබඳවද විග්‍රහ කිරීම පෙන්වාදිය හැකිය.


මීට අමතරව අවශ්‍යනම් මහජන ආරක්ෂක ආඥා පනතේ හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් කලින් කලට සකස් කරනු ලබන රෙගුලාසි මගින්ද අමතර බලතල ආරක්ෂක හමුදාවන් වෙත ලබාදිය හැකිය.

එනම් හමුදාවන් පවත්වාගෙන යනු ලබන්නේ ප්‍රධමය රාජකාරී සඳහා පමණක්ය යන්න නීතිය පිළිබඳ හා හමුදා රාජකාරී පිළිබඳව අවබෝධයක් නොමැති පාර්ශවයන්ගේ නිසරු නිෂ්ඵල නිරර්ථක ප්‍රකාශයක් පමණි.

මෙවැනි කාර්යයකදී වෙනත් රාජ්‍ය සේවකයින් අභිබවා හමුදාවන් කැඳවන්නේ මන්දැයි යමෙකු හට ගැටලුවක් මතුවිය හැකිය. ඕනෑම අවස්ථාවකදී ඕනෑම කාර්යයක් සඳහා පුහුණු ශ්‍රමිකයින් සැපයිය හැකි එකම රාජ්‍ය නිලධාරී කොට්ඨාශය වන්නේ හමුදාවන්ය. හමුදාවක් පුහුණු වෛද්‍යවරුන්ගෙන්, ගණකාධිකාරීවරුන්ගෙන්, නීතිඥවරුන්ගෙන්, ඉංජිනේරුවන්ගෙන්, ආහාර නිෂ්පාදකවරුන්ගෙන්, කලාකරුවන්ගෙන්, සංගීතඥයින්ගෙන්, හෙද/හෙදියන්ගෙන් හා දිය, ගොඩ හා අහස්කුස ජීවිත ආරක්ෂණයේ නිපුණ හැකියාවන්ගෙන් යුතු දක්ෂ පරිණත පිරිසකින් සැදුම්ලත් ආයතනයක් වන අතර හමුදා නීතිය ප්‍රකාරව ඔවුන් මනා සංයමයකින් හා විනයෙන් යුක්තව මෙහෙය විය හැකි පරිපාලන නිලධාරීන්ගෙන්ද සැදුම්ලත් ආයතන ව්‍යුහයකි.

තවද හමුදාවන් යනු පැය විසිහතර පුරා සේවයට කැපවී ඇති පිරිසක් වන අතර, ඔවුන් රටේ සාමාන්‍ය නීතියට අමතරව විශේෂ හමුදා නීතියෙන්ද පාලනය වන විනයෙන් හා කැපවීමෙන් යුක්ත ද්විත්ව නෛතික පුද්ගල කොට්ඨාශයක් (Dual Legal Personality) වන අතර, ඔවුන්ගේ සුවිශේෂී හැකියාවන්, කැපවීම හා කාර්යක්ෂමතාවයට කිසිවෙකුට හෝ අභියෝග කළ නොහැක. ස්වකීය විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණ හටපිරිස් යොදාගනිමින් ඕනෑම කටයුත්තක් හමුදාවන් යොදා සිදුකිරීමට ස්වයං ශක්තියක් හමුදාවකට ඇත.

එබැවින් මෙවැනි ව්‍යසනයකදී බොහෝ පාලකයින් හමුදාවන් කෙරෙහි විශ්වාසය තබා ඔවුන්හට ජනතාව එවැනි ව්‍යසනයන් තුළින් මුදවා ගැනීමේ උත්තුංග රාජකාරී නියම කිරීමට පෙළඹීම ලොව පුරා රටවල දක්නට ලැබෙන දසුනකි. තවද එය නීතියේ නියම කිරීම මත පදනම් වන නීත්‍යානුකූල ක්‍රියා පිළිවෙතක් බවද අප සියලුදෙනා විසින් වටහාගත යුතුවේ.




මේජර් සදුන් ගුණවර්ධන
LLB(Colombo), LLM(KDU), Attorney at Law
නීති නිලධාරී
නීති අංශය - ආරක්ෂක අමාත්‍යාංශය

# මානව හිමිකම් පිළිබඳ දේශනයක්...



ඉකුත් සැප්තැම්බර් 21 වන දින ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) යටතේ ඇති ඒකකයන් සහ පුහුණු පාසල් හි රාජකාරියේ නියුතු සාමාජික සාමාජිකාවන් උදෙසා මානව හිමිකම් පිළිබඳ අගනා දේශනයක් 1 වන ගැමුණු හේවා බළකායේ ප්‍රධාන දේශන ශාලාවේදී පැවැත්විණ. මානව හිමිකම් කොමිෂන් සභාවේ කලාප සම්බන්ධීකාරක සාමවිනිසුරු විරංජන් ඩයස් සුමනසේකර මහතා විසින් සිදුකළ එම දේශනයට නිලධාරීන් 05 ක් සහ සෙසුනිලයින් 65 දෙනෙකු සහභාගී වූහ.

# සංචාරයක සටහන්...



53 වන සේනාංකයේ 27 වන සේනාංකාධිපති ලෙස වැඩභාරගත් බ්‍රිගේඩියර් එස්ඩබ්ලිව්එම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ඉකුත් සැප්තැම්බර් 24 වන දින එම සේනාංකය යටතේ පාලනය වන 533 වන බලසේනා මූලස්ථානය සහ 8 වන ගජබා රෙජිමේන්තුවේ සංචාරයක නිරතවන ලදී.

# අභිමානවත්ව සංවත්සර දිනය සමරයි...



ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) 26 වන සංවත්සර දිනය ඉකුත් සැප්තැම්බර් 14 වන දින මහත් අභිමානයෙන් යුතුව සමරන ලදී. ඒ නිමිත්තෙන් ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්ජ් ආරියරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් රැසක් පැවැත්විණ. මින්නේරිය ආයුර්වේද රෝහලේ සිදුකළ ශ්‍රමදානය, ආඥාපති වෙත සම්මාන මුරයක් පිරිනැමීම, සියලු නිල දිවා භෝජනය, සෝමාවතිය රජමහා විහාරයේ පැවති බෝධිපූජා පිංකම එහිදී විශේෂයෙන් කැපී පෙනුනි.

# දිරිය දරුවන්ට දිරියක් වෙමින්...



23 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් ඒබීඑස් අතුකෝරල ආර්ඩබ්ලිව්පී ගේ පුද්ගලික සම්බන්ධීකරණයෙන් 642 වන බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්පීඑම් විජේසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ උපදෙස් මත ඔඩ්ඩුසුඩාන් ග්‍රාම නිලධාරී වසමේ පදිංචි විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් සපුරා ඇති ජේ මනිමේතුකා සහ සිත්තිරා නාගරාසා යන ශිෂ්‍යාවන් වෙත මුල්‍යාධාර පරිත්‍යාග කිරීම ඉකුත් සැප්තැම්බර් 15 වන දින 64 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඒපී පල්ලාවෙල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් සිදුකරන ලදී.

# ඖෂධ පැළ රෝපණය කිරීමක්...



ආරක්‍ෂක සේනා (වන්නි) කඳවුරු භූමිය තුළ ශාඛසාර වෛද්‍ය දිනයට සමගාමීව පෝෂණ හා දේශීය වෛද්‍ය පිළිවෙත් හඳුන්වාදීම යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දියත් කරන ලද "සුව දරණී" ජාතික රුක්රෝපණ වැඩසටහනට සමගාමීව ඉකුත් සැප්තැම්බර් 17 වන දින මී, බුළු, තෙල්ලි සහ දෙළුම් වැනි ඖෂධ පැළෑටි 30 කට අධික ප්‍රමාණයක් රෝපණය කරන ලදී. මෙම අවස්ථාව සඳහා ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) බ්‍රිගේඩියර් (ප්‍රමාණි), බ්‍රිගේඩියර් පාලන/හකාස ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගි වූහ.

# රුක් රෝපණ වැඩසටහනක්...



යුද්ධ හමුදාධිපතිගේ සංකල්පයකට අනුව ආරම්භ කළ "තුරු මිතුරු නව රටක්" වන වගා සංග්‍රාමයේ එක් අදියරක් ලෙස 54 වන සේනාංකයේ සංවත්සරයට සමගාමීව රුක් රෝපණ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් 22 වන දින කල්ලාරු ප්‍රදේශයේදී සිදුකරන ලදී. 54 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්අයිජේ බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහනට 542 වන බලසේනාවේ සහ 8 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ නිලධාරීන් මෙන්ම සෙසුනිලයින්ගේ නොමඳ සහය හිමිවිය.




# "සැනසුම" යුද්ධ හමුදා සෘජුකාරක හා අංගාදේශක කාර්මිකාගාරය

උතුම් වූ සම්බුදුරජාණන් වහන්සේගේ සමාධි සුවයෙන් වැඩසිටිනා පිළිම වහන්සේ නමකගේ දර්ශනයෙන් මෙත් සිත්ව දොරටුව විවර වන ගාල්ල, කරාපිටියෙහි නිසල පරිසරයක පිහිටි "සැනසුම" නැතහොත් "යුද්ධ හමුදා සෘජුකාරක හා අංගාදේශක කාර්මිකාගාරය" වෙතින් යුද්ධ හමුදා සාමාජිකයන්ට මෙන්ම සිවිල් මහජනතාව වෙනුවෙන් සැලසෙන මහගු සේවාවන් සම්බන්ධයෙන් දැනුවත් කිරීම උදෙසා මෙම ලිපිය රණවිරු පාඨක ඔබ වෙත ගෙන එමි.

"දක්ෂිණ ආබාධිත මධ්‍යස්ථානය" ලෙස සිවිල් ආයතනයක් වශයෙන් පැවති මෙම ආයතනය එහි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ඉතා සද්භාවයෙන් යුතුව, පුළුල් පරාසයක් ඔස්සේ නවදුරටත් සේවාවන් උසස් මට්ටමින් යුතුව සැපයීමට ඉඩප්‍රස්තාව සැලසීම වස් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය වෙත පරිත්‍යාග කරන ලදී. ඉන්පසු එවකට ආරක්ෂක ලේකම් වශයෙන් කටයුතු කළ වත්මන් සන්නද්ධ හමුදා සේනාධිනායක මෙන්ම

> "මිනිසෙකු විසින් ලද හැකි උතුම්ම සම්පතක් ඇත්නම් එය ඔහු හා ඇය ලබන 'සැනසුම' නැත්නම් සැනසිමයි"

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ මගපෙන්වීම යටතේ වර්ෂ 2011 ක්වූ නොවැම්බර් මස 01 දිනට යෙදුණු සුබ මොහොතින් රණවිරුවන්ගේ හා සිවිල් මහජනතාවගේ සුබසිද්ධිය උදෙසා සේවය සැලසීමේ උදාර අරමුණින් "සැනසුම" බිහිවිය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පුනරුත්ථාපන අධ්‍යක්ෂක මණ්ඩලය හා රණවිරු සෙවණ රාගම යටතේ පාලනය වන මෙම ආයතනය යුද්ධ හමුදාව වෙත පවරාදීමේදී "දක්ෂිණ ආබාධිත මධ්‍යස්ථානය" යටතේ රාජකාරියෙහි නිරතව සිටි වසර 17 කට අධික මනා අත්දැකීමෙන් හා පලපුරුද්දෙන් හෙබි විදෙස් පුහුණුවෙන්ද සවිමත් වූ සෘජුකාරක හා අංගාදේශක වෘත්තිකයින් හා කාර්මික ශිල්පීන්ද මෙහි කාර්ය මණ්ඩලය වෙත එක්වූහ. තවද යුද්ධ හමුදාව වෙතින් පුහුණුව ලබාදී එක්කළ කාර්මිකයින්ද සමගින් ඉතා ගුණාත්මක හා උසස් මට්ටමින් යුතු සේවාවක් සලසාදීමට ඔවුන් සමත්වී ඇති බැව් මෙහිදී සඳහන් කළ යුතුමය.

පුරා තිස් වසරක් මුළුල්ලේ පැවති කුරිරු යුද්ධයෙන් තුවාල ලබා රණක්ෂිතයට පත් වීරෝධාර රණවිරුවන්, රාජකාරියෙහි නියුතුව සිටින හා විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයින්, ඔවුන්ගේ ළඟම ඥාතීන්, යුද්ධ හමුදා සේවයේ නියුතු සිවිල් සේවක මහතුන් හා ද්විතිනය පදනම මත රාජකාරී සඳහා අනුයුක්ත කර













ඇති අයවලුන් මෙන්ම දිවයිනේ නන් දෙසින් සහනයක් සොයා පැමිණෙන අත් හා පාද අහිමිවූ සහ විවිධ ශාරීරික ආපදාවන්ට ලක්වූ සිවිල් වැසියන් සඳහාත් අවැසි සෘජුකාරක හා අංගාදේශක සේවාවන් ලබාදීම මෙම ආයතනය මඟින් සැලසෙනු ලබන ප්‍රමුඛතම කාර්යභාරය වේ.

මෙම ආයතනය වෙතින් මේ වන විට ගාල්ල, මාතර, හම්බන්තොට, මොණරාගල හා කළුතර යන දිස්ත්‍රික්කයන්, "අභිමංසල" කඹුරුපිටිය, මූලස්ථාන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව - බූස්ස යන ස්ථානයන්හි හා සෙසු දිස්ත්‍රික්කයන්ද නියෝජනය කරමින් සිටින රණක්ෂිතයට පත් රණවිරුවන් 795 දෙනෙකු හා සිවිල් වැසියන් 262 ක් සඳහා අවැසි සේවාවන් සැපයීම සිදුකර ඇත.

සිවිල් ආබාධිත පුද්ගලයින්ට අවශ්‍ය වන කෘත්‍රිම පාද, ශල්‍ය උපකරණ සම්බන්ධයෙන් වූ ප්‍රතිකාර හා ශල්‍ය සපත්තු මෙහිදීම නිෂ්පාදනය කරන අතර, නිෂ්පාදන අමුද්‍රව්‍ය සඳහා වැයවන මුදල පමණක් අයකර ගනිමින් ඉතාමත් සහනදායී මිලකට සකසා ගැනීමට හා අලුත්වැඩියා කරගැනීමට අවස්ථාව සලසා දී තිබීම මහත් පැසසිය යුතු කරුණකි. මෙම කාර්මිකාගාරයෙන් නිපදවන ශල්‍ය උපකරණ පිළිබඳව ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ නිරන්තර ඇගයීමට ලක්වීමද ඔවුන් ලද ජයග්‍රහණයකි. එබැවින් ඔවුන් විසින් ඉතා විශ්වාසයකින් යුතුව සියළු වයස් කාණ්ඩවල ආබාධ සහිත සිවිල් අයවලුන්ගේ ශල්‍ය උපකරණ සම්බන්ධයෙන් වූ ප්‍රතිකාර සපුරා ගැනීමට මෙම ආයතනය වෙත යොමු කරනු ලබයි. එය හැමවිටම මහත් සැනසුමකි.

"සැනසුම" සෘජුකාරක හා අංගාදේශක කාර්මිකාගාරය වෙතින් සැලසෙනු ලබන සේවාවන් පිළිබඳව තවදුරටත් ඔබව දැනුවත් කිරීම උදෙසා මෙලෙස පහත සටහන තබමි.

අ. සෘජුකාරක (Orthoses) සම්බන්ධයෙන් වූ ප්‍රතිකාර (පාද ආධාරක හා කොඳු ඇටපෙළෙහි අසාමාන්‍යතා සැකසීම).

ආ. අංගාදේශක (Prostheses) සම්බන්ධයෙන් වූ ප්‍රතිකාර (දණහිසින් පහළ හා ඉහළ කෘත්‍රිම පාද සකසනු ලබන අතර, කෘත්‍රිම අත් යුද්ධ හමුදා සාමාජිකයින්ට පමණක් සැකසේ).

ඇ. භෞත චිකිත්සක (Physiotherapy) සේවාවන්.

ඇ. ශල්‍ය පාවහන් සැකසීම (Pedorthics) (දියවැඩියා රෝගීන් සඳහාම සකසන විශේෂිත වූ ශල්‍ය පාවහන් හා පාද අසාමාන්‍යතා සඳහා පාද ආධාරක සැකසීම).

තවද, ඉහත සේවාවන් ලබාදීමේදී යුද්ධ හමුදා සාමාජිකයින් හට සේවයේ යෙදී සිටීමේදී මෙන්ම විශ්‍රාම යාමෙන් අනතුරුවද කිසිදු මුදලක් අය කිරීමකින් තොරව එම සේවාවන් ලබාදීම සිදුකරනු ලබන අතර, ඔවුන්ගේ ළඟම ඥාතීන්, යුද්ධ හමුදාවේ සේවය කරන සිවිල් සේවකයින් සහ ද්විතීයනය පදනම මත යුද්ධ හමුදා රාජකාරී සඳහා අනුයුක්ත කර ඇති සාමාජිකයන් සඳහාද නිෂ්පාදනයන්ට වැයවන මුදල පමණක් අයකර සේවාව ලබාදීම සිදුවේ.

"සැනසුම" වනාහි වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සියලු රණක්ෂිතයට පත් විරෝධාර හමුදා සෙබළුන්ට මෙන්ම විවිධ රෝග හා අනතුරු තත්වයන් හේතුවෙන් ආබාධිත තත්වයට පත් සිවිල් පුරවැසියන් සඳහාද පළමු පෙළෙහි සේවාවක් සපයමින් ඔවුන්ගේ ආබාධිත තත්වයන් ජයගනිමින්, නැවතත් ස්වාධීන පුද්ගලයෙකු ලෙස නැගී සිටීම සඳහා උරදීමට නිබඳවම කැප වී ඇති උත්තරීතර ආයතනයක් බැව් සටහන් තබනුයේ මහත් හදපිරි ගෞරවයෙනි.

පාඨක ඔබගේ දැනගැනීම උදෙසාත් ඉහත සඳහන් සේවාවන් සපුරා ගැනීම සඳහාත් පිළිසරණක් සොයමින් සිටිනා පුද්ගලයන් වෙනුවෙනුත් "සැනසුමෙහි" මංපෙත් විවර කරදීම සඳහා සම්බන්ධ කරගත හැකි ලිපිනය හා දුරකතන අංක පහත සටහන් කරමි.

*ලිපිනය :-*
*යුද්ධ හමුදා සෘජුකාරක හා අංගාදේශක කාර්මිකාගාරය,*
*නො : 103/1, නිර්මූර් හර්ස් පාර, ගාල්ල*

*දුරකතන අංක :- 091-2233994 / 091-2233746*

*ෆැක්ස් අංකය :- 091-2233994*

*විද්‍යුත් තැපැල් ලිපින :-*
*p&oworkshopgalle@army.lk /*
*sanasumapo@gmail.com*




## හරවත් වැඩමුළුවක්...

ආඥාපති හකාස අණසක මේජර් ජෙනරාල් අයිඹඩබ්ලිව් මාදොල ගේ පූර්ණ අධීක්ෂණයෙන් හකාස අණසක මූලස්ථානය යටතේ පාලනය වන සේවා රෙජිමේන්තුවලට අයත් නිත්‍ය/ස්වේච්ඡා ඒකකවල දෙවන අණදෙන නිලධාරීන්ගේ වෘත්තීය දැනුම වර්ධනය කිරීමේ අරමුණින් සංවිධානය කළ එක්දින වැඩමුළුවක් ඉකුත් සැප්තැම්බර් 16 වන දින එම මූලස්ථානයේදී පවත්වන ලදී. එම වැඩමුළුව සඳහා දෙවන අණදෙන නිලධාරීන් 59 දෙනෙකු සහභාගි වූ අතර, එම අවස්ථාවේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වීඩියෝ තාක්ෂණය ඔස්සේ සහභාගි වී සිටි සියලුම නිලධාරීන් ඇමතීමද විශේෂත්වයකි.

එහිදී යුධෝපකරණ ක්‍රියා පිළිවෙත, ණය ලබාදීමේ පිළිවෙත, ණය සඳහා පොලිය ගණනය කිරීම සහ අවශ්‍ය ලිපි ලේඛණ, රාජ්‍ය සහ රාජ්‍ය නොවන මුදල් ගිණුම් තැබීම, යුද්ධ හමුදා පනතේ වැදගත්කම, මූලික පරීක්ෂණ උසාවියක තිබිය යුතු අත්‍යවශ්‍ය අංග යන කරුණු ඇතුළත් දේශන තුළින් මෙම වැඩමුළුව හරවත් විය.




## කෙඩෙට් නිලධාරීන් යාපනයේ සංචාරයක...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ පාඨමාලා අංක 88 හි පුහුණුව ලබන කෙඩෙට් නිලධාරීන් 46 දෙනෙකු යාපනය අර්ධද්වීපයේ දෙදින අධ්‍යයන චාරිකාවක් සඳහා එක්වූහ. යාපනය ආරක්ෂක සේනා මූලස්ථානය වෙත පැමිණි කෙඩෙට් නිලධාරී කණ්ඩායම පිළිගැනීම එම මූලස්ථානයේ මාණ්ඩලික නිලධාරීන් විසින් සිදුකළ අතර, යාපනය බළ ප්‍රදේශයේ ඇති වැදගත් ස්ථාන නැරඹීම හා යුධමය වාතාවරණයෙන් පසු යුද්ධ හමුදාව විසින් එම ප්‍රදේශයේ සිදුකළ කාර්යභාරය පිළිබඳ දැනුවත් කිරීමක්ද එහිදී සිදුකරන ලදී.



# පාපන්දුවෙන් ජය ලබා...

22 වන සේනාංකයේ සේනාංකාධිපතිගේ සංකල්පයකට අනුව එම බලප්‍රදේශයේ බළසේනා/ ඒකක අතර එකමුතුභාවය හා ක්‍රීඩා කෞශල්‍ය වර්ධනය කරවීම සඳහා පාපන්දු තරගාවලියක් සංවිධානය කරන ලදී. ඊට කණ්ඩායම් නවයක් සහභාගී වූ අතර, එහි අවසන් තරග වටය සඳහා 6 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය හා 2 (සේවා) ගජබා රෙජිමේන්තුව තේරී පත්විය. ඉකුත් සැප්තැම්බර් මස 20 වන දින 22 වන සේනාංක ක්‍රීඩා පිටියේදී පැවැති එහි අවසන් තරගයෙන් ගෝල 4 - 2 ක් ලෙස 6 වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා කණ්ඩායම ජයග්‍රහණය හිමි කරගත්හ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ 22 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් ජයග්‍රාහී කණ්ඩායම් සඳහා තිළිණ ප්‍රදානය සිදු කෙරිණ.



# ක්‍රිකට් තරඟාවලියෙන් ජය ලබා...

යුද්ධ හමුදාව සහ ප්‍රදේශයේ ජීවත්වන සිංහල, දමිළ ජනතාව අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් 19 වන ගැමුණු හේවා බළඇණිය විසින් ඉකුත් සැප්තැම්බර් 13 වන දින 593 පාබල බලසේනා ක්‍රීඩා පිටියේදී ක්‍රිකට් තරගාවලියක් සංවිධානය කරන ලදී. ඒ අනුව අදාළ තරගාවලිය සඳහා 19 වන ගැමුණු හේවා බළඇණි ක්‍රිකට් කණ්ඩායම, කෝකිලායි සිංහල ගම්මානයේ සෙන්ට් සෙබස්තියන් කණ්ඩායම, කර්නාටකේණි දමිළ ගම්මානයේ විග්නේශ්වරන් "ඒ" සහ "බී" යන ක්‍රිකට් කණ්ඩායම් සහභාගි වූ අතර, එහි ශූරතාවය 19 වන ගැමුණු හේවා බළඇණි ක්‍රිකට් කණ්ඩායම හිමිකරගත් අතර, විග්නේශ්වරන් "ඒ" කණ්ඩායම අනුශූරතාවය හිමිකර ගත්හ.

# LEARN ENGLISH

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## Let

යම්කිසි ක්‍රියාවක් සිදුකිරීමට යමෙකුට ඉඩ දෙන්න යන අර්ථය ඇතිව භාවිතා කරන උපකාරක ක්‍රියා පදයක් ලෙස වාක්‍ය කණ්ඩ නිර්මාණය කිරීමේදී බහුලව භාවිතා වේ.

***Fomular*** - සූත්‍රය

> **Let + Objective Pronoun + Verb (Infinitive) + Object + Rest.**
> ලෙට් + ඔබ්ජෙක්ට් ප්‍රෝනවුන් + වර්බ්(ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
> ඉඩ දෙන්න + කර්ම කාරක සර්වනාම පද + ක්‍රියා පදයේ මූල ස්වරූපය + ඉතිරිය.

***Ex*** / උදා :-

1. Let me go out.
   ලෙට් මී ගෝ අවුට්.
   මට එළියට යන්න ඉඩ දෙන්න.

2. Let them speak.
   ලෙට් දෙම් ස්පීක්.
   ඔවුන්ට කථා කරන්න ඉඩ දෙන්න.

3. Let him sing a song.
   ලෙට් හිම් සිංග් අ සෝන්ග්.
   ඔහුට සිංදුවක් කියන්න ඉඩ දෙන්න.

4. Let Kasun play.
   ලෙට් කසුන් ප්ලේ.
   කසුන්ට සෙල්ලම් කරන්න ඉඩ දෙන්න.

***Nota Bene*** / සැ.යු :-

***Let*** යන පදය ආකාර කිපයකට භාවිතයේ යෙදෙනු දැකිය හැකිය. එහිදී යම් අයෙකුට යම්කිසි කාර්යයක් කිරීමට ආරාධනා කිරීමේදී හෝ ඉල්ලීමක් කිරීමේදී ඉතා සරළව භාවිතා කළහැකි පෙර ඇදි ක්‍රියා පදයක් ලෙසද භාවිතා කළ හැක.

***Ex*** / උදා :

1. Let us go = Let's move.
   ලෙට් අස් ගෝ.
   අපි යමු.

2. Let us speak = Let's speak.
   ලෙට් අස් ස්පීක්.
   අපි කතා කරමු.

ඉහත පෙන්වා දී ඇති ආකාරයට අනුව යම් ආරාධනාවක් කිරීමේදී හෝ ඉල්ලීමක් කිරීමේදී **us** - අපි යන අර්ථය සමග **Let** යන පදය සංයෝග වී **Let's** වශයෙන් භාවිතාවීම පමණක් වාක්‍යවල දැකිය හැකිය. එහිදී **Let's** යන පදයේ අර්ථය අපි කරමු ලෙස පිළිඹිබු වේ.

**Let :-** "ඉඩ දෙන්න" ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම කණ්ඩය වාක්‍යයේ භාවිතා වේ.

**Object Pronoun :-** කර්ම කාරක සර්වනාම පද වශයෙන් පහත පෙන්වාදී ඇති පද භාවිතා වේ. **me** - මට, **us** - අපට, **them** - ඔවුන්ට, **her** - ඇයට, **him** - ඔහුට, **it** - ඌට. තවද නිදසුන්හි පෙන්වාදී ඇති පරිදි මෙහිදී පුද්ගලයෙකුගේ නමක් වුවද භාවිතා කළ හැක.

**Verb :-** ක්‍රියා පදය වාක්‍යයේ භාවිතා කිරීමේදී ක්‍රියා මූල **Infinitive** පදයක් ලෙස භාවිතා කළ යුතුය.

**Rest :-** ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

> Analysis of the sentence formation
> වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේෂණය.
> Let + Object Pronoun + Verb (Infinitive) + Object + Rest.
> ලෙට් + ඔබ්ජෙක්ට් ප්‍රෝනවුන් + වර්බ්(ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
> ඉඩ දෙන්න + කර්ම කාරක සර්වනාම පද + ක්‍රියා පදයේ මූල ස්වරූපය + ඉතිරිය

Let me go out.
ලෙට් මී ගෝ අවුට්.
මට එළියට යන්න ඉඩ දෙන්න.

ප්‍රායෝගික අභ්‍යාස සඳහා වාක්‍ය නිර්මාණය කර වාක්‍ය රටාවෙහි භාවිතය මැනවින් අවබෝධකර ගනිමු.

***" English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද ඔබට මඟ හැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

**කපිතාන් චමින්ද ලියනගේ**
**[illegible]**
**සංඥා පුහුණු පාසල - [illegible]**
**www.englishvision.lk**



## "සෞභාග්‍යයේ දැක්ම" ට යුද හමුදාවේ අතහිත...

# උපාධිධාරීන්ගේ පුහුණු වැඩසටහන

අතිගරු ජනාධිපතිතුමන්ගේ සංකල්පයකට අනුව දිවයින පුරා ක්‍රියාත්මක වන උපාධිධාරීන් සඳහා වූ නායකත්ව පුහුණු වැඩමුළුව පසුගියදා ආරම්භ විය. යුද්ධ හමුදාවේ සහයෝගයෙන් ඇරඹුණු මෙම පුහුණු වැඩමුළුව තුළින් යහපත් ආකල්පයන්ගෙන් හෙබි නායකත්ව ගුණාංගවලින් පරිපූර්ණ රාජ්‍ය සේවකයින් පිරිසක් බිහිකිරීම අරමුණයි.

දිවයින පුරා විවිධ කඳවුරුවලදී එලෙස උපාධිධාරීන් සඳහා ඇරඹුණු වැඩමුළු පහතින් දැක්වේ.




59 සේනාංකයේදී




විජයබාහු පාබල රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී




කිලිනොච්චි නෙළුම්පියස ශ්‍රවණාගාරයේදී

# ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) යටතේ පාලනය වන පුහුණු පාසල් හි





5(ස්වේ) ශ්‍රී ලංකා පාබල හමුදා ඒකකයෙහි





5 වන ගැමුණු හේවා බළකා රෙජිමේන්තුවෙහි





ප්‍රගුණ වෙඩික්කරු පුහුණු පාසල සහ 2(ස්වේ) ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ පැවති වැඩසටහන





ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකා පුහුණු පාසල - ගන්නෝරුවෙහි




සංඥා පුහුණු පාසල - බුවැලිකඩ




ස්වේච්ඡා පුහුණු පාසල - දියතලාව

# සෙබළ සිතට මානසික ජවය...



මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්‍ෂ බ්‍රිගේඩියර් එම්පී කරුණාරත්න අයිපී විසින් වැඩසටහන පිළිබඳ හඳුන්වා දෙමින්



යුද්ධ හමුදා සේවයේ යෙදී සිටින නිලධාරීන් හා සෙසු නිලයින් හට රාජකාරියේදී මෙන්ම සිවිල් ජීවිතයේදී ඇතිවන ගැටළු නිරාකරණය කර ගැනීමට සහ නිවැරදිව තීරණ ගැනීම සඳහා උසස් මානසික ශක්තියක් ලබාදීමේ අභිලාෂයෙන් "සෙබළ සිතට මානසික ජවය" නමින් වූ එක්දින වැඩසටහනක් බවුන්සෙත් මානසික සුවසෙවන විපස්සනා භාවනා මධ්‍යස්ථානය - දෙකටන හිදී ඉකුත් සැප්තැම්බර් 17 වන දින පවත්වන ලදී. යුද්ධ හමුදා මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලය මගින් 105 වෙනි වරට සංවිධානය කරන ලද එම වැඩසටහන සඳහා යුද්ධ හමුදාවේ අංග හා ආයතන නියෝජනය කරමින් නිලධාරීන් හා සෙබළ සෙබළියෝ 54 දෙනෙකු සහභාගී වූහ.





## ප්‍රතිත්‍රස්ත හා නගරබද සටන් පුහුණු මහගෙදර

# යුද හමුදා පුහුණු පාසල මාදුරුඔය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ස්වකීය ජාතික මෙහෙවර මනාකොට ඉටුකරමින් වසර 30 ක ත්‍රස්තවාදී ශාපයෙන් රට මුදවා ගෙන වසර 11 ක් ගතවන මෙම කාල වකවානුවේ ස්වකීය භට පිරිස් ඕනෑම අවස්ථාවක් සඳහා සූදානම් කිරීම වස් පුහුණුව මුල් තැන්හිලා කටයුතු සිදුකරනු ලබයි. ශ්‍රී ලංකාව නිරන්තරයෙන් අභ්‍යන්තර ආරක්ෂාව හා ප්‍රතිත්‍රස්ත කටයුතු සඳහා මැදිහත් වීම හේතුවෙන් යුද හමුදාවක් වශයෙන් පාබල පුහුණුව අතිශය වැදගත් වේ. මෙහිදී නගරබද සටන්, ප්‍රතිත්‍රස්ත සටන්, අභ්‍යන්තර ආරක්ෂක රාජකාරීන් හා වන ගත සටන් එකම ස්ථානයක පුහුණු කිරීම සිදුකරන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම යුද්ධ හමුදා පුහුණු පාසල වන්නේ මාදුරුඔය යුද හමුදා පුහුණු පාසලයි.



ප්‍රථම සේනාවිධායක
ලුතිනන් කර්නල් ඩබ්ලිව්ජේ ද සිල්වා
පීඑස්සී

මාදුරුඔය යුද හමුදා පුහුණු පාසලේ ප්‍රථම සේනාවිධායක වශයෙන් ලුතිනන් කර්නල් ජීඩබ්ලිව්ජේ ද සිල්වා පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී එවකට රාජකාරී භාරගනු ලැබ්‍ය. යුද හමුදා පුහුණු පාසල මුලින්ම පනාගොඩ ස්ථාපිත කරවූ අතර, ඉන් පසු 1985 වර්ෂයේ මාදුරුඔය වර්තමාන පුහුණු පාසල් පරිශ්‍රය වෙත ගෙන එන ලදී. 1980 දශකයේ මාදුරුඔය වේල්ලේ ඉදිකිරීම සඳහා පැමිණි කැනේඩියානු සමාගමක් වන එෆ්ඒඑෆ්ජී (FAFG) විසින් ඉදිකරනු ලැබූ ගොඩනැගිලි සංකීර්ණය මත සියළු යටිතල පහසුකම් වලින් සමන්විතව මාදුරුඔය යුද හමුදා පුහුණු පාසල ස්ථාපිත කරන්නට විය. මෙහි ආදර්ශ නගර ඉදිකිරීම් කටයුතු 1986 වර්ෂයේ මැද භාගයේදී සිදුකරන ලදී. ඉන්පසු මෙය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ හමුදා පුහුණු පාසලක් ලෙස දෙස් විදෙස් හමුදා නිලධාරීන් සහ සෙසුනිලයන්ගේ වෘත්තීය පුහුණුව වර්ධනය කරන පුහුණු මධ්‍යස්ථානයක් ලෙස බැබලෙන්නට විය. මෙම යුද හමුදා පුහුණු පාසලේ දර්ශණය වන්නේ සොල්දාදුවන් සහ නිලධාරීන් ප්‍රතිත්‍රස්ත සටන් සඳහා වෘත්තීය පරිණතභාවයන් උදෙසා පුහුණු කිරීම වේ.



වත්මන් සේනාවිධායක
බ්‍රිගේඩියර් ඩීඑම්කේඩීබී පුස්සැල්ල
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී



වත්මන් අණදෙන නිලධාරී
කර්නල් ඩීඩීජේඩී දෙල්මතිලක යූඑස්පී පීඑස්සී



ප්‍රධාන උපදේශක
ලුතිනන් කර්නල් ඩීපීසී ගුණසේන
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී

මෙහි පරමාර්ථය වන්නේ තරුණ නිලධාරීන් හා පාබල බලඇණි බලගැන්වීම සහ ඔවුන්ගේ පුද්ගලික හා කණ්ඩායම් සටන් ඵලදායිත්වය සහ ඒකාබද්ධතාවය සැලසුම්වලදී, ක්‍රියාන්විත මෙහෙයුම්වලදී සහ අර්ධ සම්ප්‍රදායික සහ වනත්‍රස්ත සටන් පරිසරයක් තුළදී ප්‍රදර්ශණය කිරීමයි. ඒ සඳහා පහත සඳහන් කාර්යයන් ඉටුකරනු ලබයි.


- ප්‍රතිත්‍රස්ත සටන් උදෙසා නායකයන් සහ ඒකකයන් පුහුණු කිරීම.
- සංවර්ධනය හා බලගැන්වීම (යුධ හමුදා වන සටන් පුහුණු හැකියාවන් හා වන සටන් පුහුණු ඒකක).
- පාබල සටන් බලඇණිවල සටන් උපයෝගීතාවය වර්ධනය සඳහා නැවුම් සහ උසස් පාබල පුහුණු මෙහෙයවීම.
- වෘත්තීය දක්ෂතාවයන් සහ වන සටන් සහය ඒකකයන් සංවර්ධනය සහ බලගැන්වීම.
- නගරබද සටන් පුහුණු දක්ෂතාවයන් සහ වන සටන් සහය ඒකකයන් සංවර්ධනය සහ බලගැන්වීම.
- නිදහස් සංග්‍රාමික හැඩගැන්වීම් සහ සූදානම් කිරීම.

වර්ෂය පුරාම මෙම පුහුණු පාසලේ දේශීය/විදේශීය නිලධාරී/සෙසුනිලයින් හට පහතින් දක්වා ඇති පාඨමාලාවන් පවත්වනු ලබයි.

| අ.අ | පාඨමාලාවේ නම |
|---|---|
| 1 | ප්‍රතිත්‍රස්ත යුධ උපක්‍රම හා කැලෑබද සටන් පුහුණු පාඨමාලාව (දේශීය/විදේශීය නිලධාරී) |
| 2 | තරුණ නිලධාරී පාඨමාලාව |
| 3 | විධායක අධිකාරී පාඨමාලාව |
| 4 | විශේෂ පාබල ක්‍රියාන්විත පාඨමාලාව |
| 5 | ප්‍රතිත්‍රස්ත යුධ උපක්‍රම හා කැලෑබද සටන් පුහුණු පාඨමාලාව (සෙසුනිල) |
| 6 | ජ්‍යෙෂ්ඨ කොනොනි/කොනොනි යුධ උපක්‍රම පාඨමාලාව |
| 7 | බලඇණි සංස්කරණ උපදේශක පාඨමාලාව |
| 8 | උපදේශක පාඨමාලාව (යුහපුපා මාදුරුඔය) |
| 9 | එජාසාසා මෙහෙයුම් පාඨමාලාව |
| 10 | උපාධිධාරී නායකත්ව පුහුණු වැඩමුළුව (අධියර - 1) |

වත්මන් යුද්ධ හමුදාධිපති ධූරය හොබවන කීර්තිමත් පාබල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වන ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සෘජු අධීක්ෂණය යටතේ විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ දියුණුවට පත් වෙමින් තිබෙන මාදුරුඔය යුද හමුදා පුහුණු පාසල පුහුණු කටයුතු තුළ තම නිම් වළලු පුළුල් කරමින් පවතී.

පුහුණු පාසල පසුගිය කාල සීමාව තුළ සියලුම පාඨමාලා විෂය නිර්දේශ යාවත්කාලීන කළ අතරම භෞතික සංවර්ධනය වේගවත්ව සිදුවෙමින් පවතී. පාසල් භූමිය තුළ සියලුම මංමාවත් වල කාපට් ඇතිරීම, නව කඳවුරු සම්මාන මුර පිටිකාවක් ඉදිකිරීම, නව මුළුතැන්ගෙයක් ස්ථාපිත කිරීම, වසර ගණනාවක් පැරණි ගොඩනැගිලි නවීකරණය කිරීම හා නවතමයෙන් ඉදිකිරීමට කටයුතු යොදා ඇති දෙමහල් ගොඩනැගිල්ල ඉන් ප්‍රමුඛ කටයුතු ලෙස සඳහන් කළ හැකිවේ.





# සංඥා බළකායට ඡායාරූප පුවරුවක්...

ශ්‍රී ලංකා සංඥා බළකායට අයත් විශ්‍රාමලත් සහ දැනට සේවයේ නියුතු මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ඡායාරූප ඇතුළත් කරන ලද ඡායාරූප පුවරුවක් ඉකුත් සැප්තැම්බර් 05 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සංඥා බළකාධිපති සහ අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීඑච්එන් දෙමටන්පිටිය එන්ඩියූ පීඑස්සී ගේ සුරතින් විවෘත කරන ලදී. එය විශ්‍රාමලත් මේජර් ජෙනරාල්වරු 14 දෙනෙකුගේද, සේවයේ නියුතු නිලධාරීන් 04 දෙනෙකුගේද ඡායාරූපවලින් සමන්විතය.



# සෙසුනිලයින්ට අගනා වැඩමුළුවක්...

සිය මාතෘභූමියේ භෞමික අඛණ්ඩතාවය හා ඒකීයභාවය වෙනුවෙන් තම තාරුණ්‍ය කැපකොට රණක්ෂිතයට පත් රණවිරුවන් රැක බලාගැනීම පරම යුතුකමකි. ඒ වෙනුවෙන් කැපවී සිටින උපස්ථායක සෙනින්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලිය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම සඳහා වූ පුහුණු වැඩමුළුවක් ඉකුත් අගෝස්තු මස 10 වන දින සිට 28 වන දින දක්වා අදියර 02 ක් යටතේ පැවැත්විණ. රණවිරු සෙවණ, අභිමංසල 1, 2, 3 සහ මිහිඳු සෙත් මැඳුර යන සුවසහන මධ්‍යස්ථාන/ නිකේතනයන්හි රාජකාරී කරනු ලබන උපස්ථායක සෙනින් 59 දෙනෙකුගේ සහභාගීත්වයෙන් වූ අදාළ පුහුණු වැඩසටහන අභිමංසල 3 සුවසහන නිකේතනයේදී සිදුකරන ලදී. මෙම පුහුණු වැඩමුළුව පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී සහ අභිමංසල 3 සුවසහන නිකේතනයේ සේනාවිධායක කර්නල් එච්වී විජේගුණවර්ධන ආර්එස්පී ගේ පූර්ණ අධීක්ෂණය යටතේ පවත්වනු ලැබූහ.





512 වන පාබල බලසේනා මූලස්ථානය ස්ථාපිත කර ඉකුත් සැප්තැම්බර් 01 වන දිනට වසර 25 ක් සපිරීම නිමිත්තෙන් එහි බලසේනාධිපති බ්‍රිගේඩියර් එම්එච්ඒ රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත් සංවත්සර වැඩසටහනක් පවත්වන ලදී. ලේ දන්දීම, බලසේනාධිපති වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, හට පිරිස් ඇමතීම, සියලු නිල තේ පැන් සංග්‍රහය, රට ජාතිය වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් සිහිකරමින් පුණ්‍යානුමෝදනා සිදුකිරීම එහිදී පැවති විශේෂ වැඩසටහන් අතර ප්‍රධාන විය.

# 25 වන සංවත්සරය සමරමින්...



511 වන පාබල බලසේනා මූලස්ථානයේ 25 වන අභිමානවත් සංවත්සරය ඉකුත් සැප්තැම්බර් 08 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් බලසේනාධිපති කර්නල් ටීඑම්ආර්බී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. එහිදී ආගමික වතාවත්වලට මුල්තැනක් දෙමින් ඇරඹි එම කටයුතුවලට බලසේනාවේ සියලු නිලයින් සාමූහිකව එක්වූහ.



# ආකල්ප සංවර්ධනය තුළින් යහපත් පවුල් සංස්ථාවක් ගොඩ නඟා ගනිමු...

*2020 ජූලි කලාපය හා සම්බන්ධවයි...*

වර්තමාන සමාජයේ පවුල් සංස්ථාවන් අධ්‍යයනය කරන විට පෙනී යන්නේ විස්තාරිත පවුල හා බහුවෛවාහික පවුල් සංස්ථා ක්‍රමයෙන් ඈත් වී ඇති බවයි. න්‍යෂ්ටික පවුල් සංස්ථාව ග්‍රාමීය මෙන්ම නාගරිකව සීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ඇත. පවුල් සංස්ථාව තුළ බිරිඳ සහ ස්වාමිපුරුෂයා පිළිබඳ සාකච්ඡා කිරීම වර්තමාන සමාජය තුළ කාලෝචිත වී ඇත. ඒ කුමක් නිසාද යන්න කෙටියෙන් පැහැදිලි කර බලමු. පවුල තුළ ජීවත් වන දෙමාපියන්, දරුවන් එකිනෙකා අතර තිබෙන බැඳීම පළුදු වී ඇත. බුදුදහමට අනුව සිගාලෝවාද සූත්‍රයේ සදිස නමස්කාරයේ පැහැදිලිවම දෙමාපියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකම් මෙන්ම, දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම් ගැන පැහැදිලි කර ඇත. වර්තමානයේ මෙම යුතුකම් දෙපාර්ශවයටම සාධාරණව සිදුනොවන බව පැහැදිලිය. මේ නිසා පවුල් සංස්ථාවේ මව, පියා, දරුවන් අතර තිබෙන අන්‍යෝන්‍ය සම්බන්ධය පළුදු වී ඇත. ඒ හේතුවෙන් මුළු මහත් සමාජයම දැඩි ව්‍යසනයකට ලක් වී තිබේ.

පවුලක් වටා ගොඩනැගෙන මහා සමාජය අර්ථවත් ලෙස සංවර්ධනය වීමට නම් න්‍යෂ්ටික පවුල් සංස්ථාව ආකල්පමය වශයෙන් පෝෂණය විය යුතුමය. එසේ නොවුනහොත් න්‍යෂ්ටික පවුල දුර්වල වී මහා සමාජය සමාජ ප්‍රශ්නවලින් පිරී ඉතිරී යනු ඇත. මෙම තත්වය වෙනස් කිරීමට න්‍යෂ්ටික පවුලේ එක් එක් සාමාජිකයින් ගැන විස්තර කර බලමු. බිරිඳ (මව) පිළිබඳ ශ්‍රී ලංකා සමාජය තුළ කෙසේ සටහන් වී ඇත්තේ දැයි සාකච්ඡා කරමු.

විවිධ ජාතීන්, ආගම් අතර මව ගැන ලියවී ඇති පහත සඳහන් පාඨ සියුම්ව අධ්‍යයනය කර බලන්න. එම සෑම පාඨයකින්ම කියවෙන්නේ කුමක්ද? මවගේ උත්තරීතර බවයි. එසේම මවට සමකළ හැකි වෙනත් කිසිවක් නොමැති බවයි. ඇය පවුලේ අසමසම තැනැත්තියකි.

බුදු දහමට අනුව "අම්මා යන අකුරු තුනෙන් මට ලොව්තුරු සුවය ලැබේ" එසේම "ගෙදර බුදුන් අම්මා" යන පාඨයෙන් මවගේ වටිනාකම පැහැදිලි කර ඇත. ඉස්ලාම් ආගමට අනුව නබි නායක, Prophet Mohemed විසින් මවගේ වටිනාකම සඳහන් කර ඇත්තේ මෙසේය. "පාරාදීසය ඔබේ මවගේ පාමුල පිහිටා ඇත" (Your heaven lies under the feet of your mother). ශුද්ධ වූ බයිබලයේ නික්මයාම (Exodus) ග්‍රන්ථයේ විසිවන පරිච්ඡේදයේ දස පනතෙහි 12 වන වගන්තියේ මෙසේ සඳහන් කර ඇත. "නුඹේ පියාට ද මවටද ගෞරව කරව. එවිට නුඹේ දෙවි සමිඳාණන් වහන්සේ

තුඹට දෙන රටේ තුඹ බොහෝ කාලයක් ජීවත් වන්නෙහිය". සෑම ආගමකින්ම මව ගැන ප්‍රකාශ වන්නේ නිවන, සැනසීම ලැබීමට නම් මවට උතුම් කොට සැලකීම වැදගත් බවයි.

සෑම සංස්කෘතියක් තුළම පවුල් සංස්ථාවේ මවට ඇත්තේ අනර්ඝ වූ ස්ථානයකි. වර්තමාන සමාජයේ ජීවත්වන බිරිඳ මෙම තත්වය ආරක්ෂා කරගෙන ඇත්දැයි යන්න මාධ්‍ය හරහා මෙන්ම පරිසරය තුළදී දකින්නට අසන්නට ලැබෙන ඇතැම් ක්‍රියාවන් හේතුවෙන් ගැටළුකාරී වී ඇත. බුදු දහමේ උගන්වන පරිදි භාර්යාවන් හත් දෙනෙකු පිළිබඳ පැහැදිලි කර ඇත.

<u>බුදු දහමේ උගන්වන සත් භාර්යාවන්</u>

1. වධක භාර්යාව
2. චෞර භාර්යාව
3. ආර්ය භාර්යාව
4. දාසි භාර්යාව
5. භගිනි භාර්යාව
6. සඛී භාර්යාව
7. මාතු භාර්යාව

මෙම භාර්යාවන් සත්දෙනාගෙන් තුන් දෙනෙකු දුගතියේ යන භාර්යාවන් ලෙසත් හතර දෙනෙකු සුගතියේ යන භාර්යාවන් ලෙසත් හඳුන්වා දී ඇත. එම භාර්යාවන් කෙටියෙන් හඳුනා ගනිමු.

**<u>දුගතියේ යන භාර්යාවන්</u>**

1. **වධක භාර්යාව :-** ස්වාමියා, සේවක, අසල්වැසියන් සියලු දෙනාටම කරදර කරන භාර්යාවයි.

2. **චෞර භාර්යාව :-** ස්වාමියා උපයන වස්තුව විනාශ කරන භාර්යාවයි.

3. **ආර්ය භාර්යාව :-** ස්වාමියා අවමානයට ලක්කර තමන් උත්තමාවියක් සේ කටයුතු කරන භාර්යාවයි.

**<u>සුගතියේ යන භාර්යාවන්</u>**

1. **දාසි භාර්යාව :-** සන්සුන් සිත් ඇති සැමියාගේ වදනට කීකරු භාර්යාවයි.

2. **භගිනි භාර්යාව :-** සැමියාට සොහොයුරු දයාවෙන් සලකන භාර්යාවයි.

3. **සඛී භාර්යාව :-** ස්වාමියාට මිත්‍ර සෙනෙහසින් කටයුතු කරන භාර්යාවයි.

4. **මාතු භාර්යාව :-** මවක් තම එකම පුතුට සලකන්නේ යම් සේද එපරිද්දෙන් තම ස්වාමියාට සලකන භාර්යාවයි.

මෙම සඳහන් කර ඇති භාර්යාවන් සත්දෙනා අතුරින් බිරිඳක් වන ඔබ කුමන බිරිඳද යන්න අවබෝධ වී ඇත. ඔබ ස්වාමිපුරුෂයෙකු නම් ඔබට ලැබී ඇති බිරිඳ මේ සත්දෙනාගෙන් කවුරුන්ද යන්න සසඳා බැලිය හැකිය. වර්තමානයේ බිරින්දෑවරු මේ සත්දෙනාගෙන්ම කලවම් වී ඇති බිරිඳක් දැයි යමෙකුට සිතිය හැකිය.

මීළගට ස්වාමිපුරුෂයා ගැන සාකච්ඡා කර බලමු. අතීතයේ සිට මේ දක්වාම පවුල් සංස්ථාව තුළ ස්වාමිපුරුෂයා ගෘහාධිපතියා. නැත්නම් ගෘහ මූලිකයාය.

පුරුෂාධිපත්‍ය ශ්‍රී ලංකා පවුල් සංස්ථාව තුළ එදත් අදත් එකසේම පවතී. නමුත් වර්තමානයේ ස්වාමිපුරුෂයාගේ නොමනා ක්‍රියාකලාපය නිසා පුරුෂාධිපත්‍ය, ගෘහමූලිකයා යන සංකල්ප ඇතැම් පවුල් තුළින් ඉවත් වී ඇත. මේ සියල්ලටම හේතු වී ඇත්තේ පවුල් සංස්ථාවේ වටිනාකම අවබෝධ නොවීමයි. යහපත් ස්වාමිපුරුෂයෙකු සතු ලක්ෂණ කිහිපයක් ඉදිරියට සාකච්ඡා කර බලමු.

1. කවදාවත් ඔබේ බිරිඳට බොරු කිරීමෙන් වැළකීම.

2. සෑමවිටම මහත්මයෙකු ලෙස සැලකීම.

3. බිරිඳට හිමි ගෞරවය ලබාදීම.

4. කිසිදා බිරිඳට වංචා නොකිරීම.

5. බිරිඳට උදව් කිරීමට අදිමදි නොකිරීම.

6. පවුල් සංස්ථාව තුළ තනිව තීරණ ගැනීමෙන් වැළකීම.

7. බිරිඳට සැරපරුෂ නොවී මෘදු ලෙස සැලකීම.

8. බිරිඳ ඉදිරියේ විවෘත මිනිසෙකු වීම.

9. බිරිඳට රැජිණක් සේ හැගෙන පරිදි සැලකීම.

10. බිරිඳට ආදරය කරන බව පෙන්වීම.

11. ඇයගේ ජීවිතයේ අරමුණු ලගා කරගැනීම සඳහා සහයෝගය ලබාදීම.


12. පවුලේ සැමට ආදරබර පුරුෂයෙකු වීම.

මේ ලිපිය කියවන ඔබ යහපත් ස්වාමිපුරුෂයෙක් නම් ඔබට සතුටක් ඇතිවිය හැකිය. බිරිඳකට තම ස්වාමිපුරුෂයා සතුව මෙම යහපත් ලක්ෂණ තිබේද යන්න තේරුම්ගත හැක. කෙසේ වෙතත් තම ස්වාමිපුරුෂයාගේ හෝ ස්වාමිපුරුෂයෙකු වන ඔබේ ගතිලක්ෂණ පවුල් සංස්ථාව තුළ යහපත් චර්යා රටාවක තිබිය යුතු බව මෙම කරුණු තුළින් අනාවරණය විය යුතුයි.

"ස්වාමිපුරුෂයා" යන සංකල්පය ගොඩනගා ගැනීමට නම් මෙම කරුණු ස්වාමිපුරුෂයෙකු ලග තිබිය යුතුය.

***ඉතිරි කොටස ලබන කලාපයට...***

**ලුතිනන් කර්නල් බීජීඑස් සමන්ති - ජාතික උපදේශිකා**
**මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය**









# සංචාරයක මතක...

යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාධිනායක මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩියූ යූඑස්ඒසීජීඑස්සී ඉකුත් සැප්තැම්බර් 04 වන දින ස්වේච්ඡා බලසේනාවට අයත් එකම පුහුණු පාසල වන දියතලාවේ පිහිටි ස්වේච්ඡා බලසේනා පුහුණු පාසලෙහි සංචාරයක නිරතවිය. එදින නව මුරහලක් විවෘත කිරීමද සිදුකළ අතර, සහතිකපත්‍රලාභීන් වෙත සහතික පත්‍ර ප්‍රදානය කිරීමක්ද සිදුකරන ලදී. එම අවස්ථාවට ස්වේච්ඡා බලසේනාවේ පුහුණු පරීක්ෂක වන බ්‍රිගේඩියර් කේඑන් පෙරේරා, ස්වේච්ඡා බලසේනා පුහුණු පාසලේ සේනාධිනායක කර්නල් බීඑම්ආර්ජේ බණ්ඩාර ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.





# අභිමානවත් සංවත්සර දිනය සමරමින්...

1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ අභිමානවත් 41 වන සංවත්සරය අති උත්කර්ෂවත් අන්දමින් ඉකුත් සැප්තැම්බර් 01 වන දින සමරනු ලැබීය. ඒ නිමිත්තෙන් උත්සව මාලාවක් ක්‍රියාවට නැංවූ අතර, එහිදී ආගමික වතාවත්වලට මුල්තැන හිමිවිය. අණදෙන නිලධාරී මේජර් ඩීපීඑන් බෝඹුවල වෙත සම්මාන මුරයක් හා සම්මාන ආචාර පෙළපාළියක් පැවැත්වීම, රුක් රෝපණය, සිවිල් සේවිකාවන් සඳහා ත්‍යාග පිරිනැමීම, සියලු නිල තේපැන් සංග්‍රහය මෙන්ම සියලු නිල රාත්‍රී භෝජන සංග්‍රහය එම වැඩසටහන් අතර විය. එම අවස්ථාවට තවත් සුවිශේෂී වටිනාකමක් එක්කරමින් කළුඅග්ගල ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා පුහුණු පාසලේ සෙබළියන්ගේ සුභසාධනය වෙනුවෙන් ඉදිකළ "විරුළිය" ජන අවන්හල විවෘත කිරීමද බලකාධිපති මේජර් ජෙනරාල් සීඑම්ඩීපී චන්ද්‍රසේකර එන්ඩීයූ ගේ සුරතින් සිදුවිය.



## 23 වන සංවත්සර දිනය සමරමින්...

56 වන සේනාංකය ස්ථාපිත කර අභිමානවත් 23 වන වසර සපිරීම නිමිත්තෙන් එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඩබ්ලිව්ආර් ද ආබෲ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ගේ උපදෙස් හා මඟපෙන්වීම මත ඉකුත් සැප්තැම්බර් 17 වන දින ලේ දන්දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරිණ. වව්නියා මහ රෝහලේ වෛද්‍ය චතුරාණි දිසානායක ඇතුළු හෙද කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් පැවති එම වැඩසටහන සඳහා සේනාංකය යටතේ පාලනය වන බලසේනා සහ ඒකකයන්හි යුද්ධ හමුදා සාමාජිකයින් මෙන්ම සිවිල් සේවක මහතුන්ද දායක වූහ.

## කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේදී "යුද සාහිත්‍යය" දේශනයන්...





වත්මන් හා අනාගත පරපුරට නිදහස් නිවහල් දේශයක් උරුම කරනු වස් රණවිරුවන් සිදුකළ උත්තම මෙහෙවර පිළිබඳ අලුත් පරපුර දැනුවත් කිරීම අනිවාර්යය අවශ්‍යතාවයකි. නොඑසේනම් ලේ කඳුළු දහදිය වගුරා මේ බිම නිදහස් කරගත් බව ඔවුන් විශ්වාස නොකරනු ඇත.

ඉහත අරමුණු පෙරදැරිව යුද්ධ හමුදා අංශ, ආයතන තුළ හා සිවිල් සමාජය අතර යුද සාහිත්‍යය ප්‍රචලිත කිරීම වෙනුවෙන් යුද හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙහෙයවීමෙන් දීපව්‍යාප්තව සිදුකෙරෙන දේශන මාලාවේ තවත් අදියරක් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේදී පැවැත්විණ. අවසන් වසර වෛද්‍ය සිසුන් ඇතුළු කෙඩෙට් නිලධාරීන් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් පැවති එම දේශනය මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරියෙහි නියුතු මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් මෙහෙයවන ලදී. තිස්වසක් පුරා මෙරට පැවති ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ ඓතිහාසික සටනට සෘජු ලෙස දායක වූ විරුවන් අගයමින් යුද සාහිත්‍යයක් මෙරට තුළ බිහිකිරීම මෙම වැඩසටහනෙහි අරමුණයි.

# හෙට දිනන දරුවන්ට දිරියක්...



2020 අපොස (සා/පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත සිසුන් ගේ මානසික වර්ධනය සඳහා වූ උපදේශන වැඩමුළුවක් පසුගිය සැප්තැම්බර් 08 වන දින පුනරින් මධ්‍ය මහා විද්‍යාලයේදී පැවැත්විණ. අපොස (සා/පෙළ) විභාගයට පෙනී සිටින සිසුන් යහපත් මානසිකත්වයෙන් යුතුව ඊට සහභාගී කරවීම අරමුණු කර ගනිමින් පැවැත්වූ මෙම වැඩමුළුව 5(සේව) යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ සම්බන්ධීකරණයෙන් සංවිධානය වූවකි.

# පුනරුත්ථාපන ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළුවක්...



රණවිරු සෙවණ, අභිමංසල 1, 2, 3, මිහිඳුසෙත් මැදුර සහ රණවිරු සම්පත් කේන්ද්‍රය වෙත අරෙසෙ/යා කිරීම් මත රාජකාරි සඳහා පැමිණ සිටින නිලධාරීන් හට ප්‍රථම වරට පුනරුත්ථාපන ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් ඉකුත් සැප්තැම්බර් 07 වන දින සිට 10 වන දින දක්වා රණවිරු සම්පත් කේන්ද්‍ර දේශන ශාලාවේදී පවත්වන ලදී. එම වැඩමුළුව අවසානයේ පුනරුත්ථාපන අධ්‍යක්‍ෂ බ්‍රිගේඩියර් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී විසින් ඔවුන් හට සහතික පත්‍ර ප්‍රදානය කිරීමටද කටයුතු කරන ලදී.

# අභිමානවත් දිනයක මතක සටහන්...



පදවි ශ්‍රී පුර ගල්කුලම ප්‍රදේශයේ ස්ථාපිත 62 වන සේනාංකයට වසර 10 ක් සපිරීම නිමිත්තෙන් ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් වැඩසටහන් මාලාවක් පැවැත්විණ. එහිදී බෝධිපූජා පිංකම, මහා සංඝයා වහන්සේලා වෙත සාංඝික දානය පිළිගැන්වීම, සේනාංකාධිපති බ්‍රිගේඩියර් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ වෙත කඳවුරු මුරයක් හා සම්මාන මුරයක් පිරිනැමීම සහ සියලු නිල දිවා භෝජන සංග්‍රහය යනාදිය වැඩසටහන් අතර විශේෂ විය.

# සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලියක්...



යුද්ධ හමුදා සාමාජිකයින්ගේ එකමුතුකම හා ක්‍රීඩා කොශල්‍ය වර්ධනය කරවීම සඳහා 22 වන සේනාංක මූලස්ථානය විසින් ක්‍රිකට් තරඟාවලියක් සංවිධානය කරන ලදී. ඒ සඳහා කණ්ඩායම් එකොළහක් සහභාගී වූ අතර, 6 ශ්‍රීලසසබ හා 6 විජාරෙ යන ඒකක අවසන් වටය සඳහා සුදුසුකම් ලැබීය. අගෝස්තු 16 වන දින පැවැත්වූ අවසන් මහා තරඟයේදී 6 විජාරෙ කණ්ඩායම ලකුණු 106 ක් ලබාගෙන ජයග්‍රාහී කණ්ඩායම බවට පත්වූහ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 22 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය.

# අසරණ පවුලකට සරණක්...



සිරස මාධ්‍ය ජාලය මගින් අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් "සිරස නිවස" නමින් ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘතිය යටතේ හොරණ, ගෝනපල පදිංචි කේ රුවන් ප්‍රසන්ජිත් මහතා වෙත නව නිවසක් ඉදිකර ඉකුත් සැප්තැම්බර් 18 වන දින භාරදෙන ලදී. යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් බීවීඩීපී අබේනායක යූඑස්පී එන්ඩියූ ගේ මගපෙන්වීම යටතේ 1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බළකා භට පිරිස් ඊට ශ්‍රම දායකත්වය සැපයූහ.

# රුක් රෝපණ වැඩසටහනක්...





වන ගහනය සුරකිමින් තුරු ලතා සපිරි හෙට දිනක් මතු පරපුරට දායාද කරදීමට සාර්ථක පියවරක් වශයෙන් යාපනය, කයිට්ස් මාර්ගයේ අල්ලායිපිඩ්ඩි ප්‍රදේශයේ කුඹුක් පැළ 1000 ක් රෝපණය කිරීමේ වැඩසටහනක් 512 වන බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්එච්ඊ රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් සැප්තැම්බර් 05 වන දින පවත්වන ලදී. මෙම අවස්ථාවට නාවික හමුදාවේ සහ පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙන්ම රාජ්‍ය නිලධාරීන් ද සහභාගී වූහ.



# සිංහ විරු අභිමානය...

සිංහ රෙජිමේන්තුව මාතෘභූමිය බේරා ගැනීමේ සටනේදී දක්වන ලද දක්ෂතාවයද අසමසමය. මෙහි සත්‍යතාව සනාථ කරමින් 1990 ජූලි මස 11 වන දින ත්‍රස්තවාදීන් සමග බිහිසුණු යුද්ධයකට මුහුණ දී තම භට පිරිස් සහ කඳවුර ආරක්ෂා කර ගැනීමට සටන් වැද පරම වීර විභූෂණයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රථමයෙන්ම පිදුම් ලැබූ නිලධාරියා ලෙස 3(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ කපිතාන් එස්ජු අලදෙණිය ඉතිහාසගත විය. 1991 ජූනි 14 වන දින ත්‍රස්තවාදීන්ගේ බිහිසුණු ප්‍රහාරයකින් අලිමංකඩ කඳවුර තම දිවි පුදා ආරක්ෂා කර ගනිමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පරම වීර විභූෂණයෙන් ප්‍රථමයෙන් පිදුම් ලැබූ සෙසුනිලයා ලෙස කෝප්‍රල් ගාමිණී කුලරත්න ද වසර 64 ක අභිමානවත් ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු ඉතිහාසයේ නිර්භීත වීරත්වය තම උණුසුම් ලෙයින් ලක් දෙරණ මත පතිත කරමින් ශ්‍රී ලංකා ඉතිහාසයට එක්වී ඇත. මීට අමතරව උතුරු නැගෙනහිර මානුෂීය මෙහෙයුමේදී දැක්වූ වීරත්වය උදෙසා පරම වීර විභූෂණයෙන් පිදුම් ලබමින් සැරයන් අනුර ඒඑම්, ලා/කෝ අබේරත්න බණ්ඩා එච්එම්, ලා/කෝ රාජපක්ෂ කේජීඑම් සිංහ රෙජිමේන්තු සටන් ඉතිහාසය වර්ණවත් කළ වීරෝදාර රණවිරුවෝ වෙති.

ජන්මයෙන්ම උරුම සටන්කාමීත්වය පණගන්වමින් තුන් හෙළයේ ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාවය හා සුරක්ෂිතතාවය සාක්ෂාත් කිරීම උදෙසා දිවි හිමියෙන් සටන්වැද ලක් මාතාවගේ අනාගත දූ දරුවන් වෙනුවෙන් දිවිදුන් සිංහ විරුවන් සිහිකිරීම උදෙසා සිංහ රෙජිමේන්තු භූමියේ ස්මාරකයක් ඉදි කර 1988.09.10 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ එවකට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච් වනසිංහ වීඑස්වී එන්ඩීසී විසින් විවෘත කරන ලදී.





# රණවිරු ස්මාරකය නිර්මාණය කර ඇති අංග වලින් පිළිබිඹු වන තේමාවන්



- ස්මාරකයට පිවිසෙන මාර්ගය ආරම්භයේ පිහිටි සඳකඩපහණ මගින් බෞද්ධ දර්ශනයට අනුව නොනැවතී ගමන් කරන සංසාර චක්‍රය නිරූපණය කරයි.

- එම මාර්ගය දෙපස පොපි මල් මගින් රණවිරුවන්ගේ ගතින් පිටවී ලක් භූ තලයට එක්වූ ලේ ධාරාවන් නිරූපණය කරයි.

- ස්මාරකයට පිවිසෙන මාර්ගය දෙසට මුහුණලා ඇති සිංහ පිළිරූ දෙක තුළින් ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ ප්‍රෞඪත්වය, තේජාන්විත බව, සිංහ ලාංඡනය හා රෙජිමේන්තුවට ආවේණික සටන් පාඨය වන "නිර්භීත වේගවත්" බව නිරූපණය වේ.

- රණවිරු ස්මාරකය ඉදිකර ඇති භූමියේ අතුරා ඇති කොළ පැහැති ගඩොල් මගින් රෙජිමේන්තු වර්ණ ද රතු පැහැති ගඩොල් මගින් ගෞරවාන්විත බව ද නිරූපණය කරයි.

- ස්මාරකය වටා ජල පොකුණක් ඉදිකර ඇති අතර, එමගින් සමුද්‍රෙන් වටවූ මාතෘ භූමිය මත තම අභීත හස්තය දරා සිටින රණවිරුවන්ගේ අප්‍රමාණ වූ මෙහෙය නිරූපණය කරයි. එමගින් ස්මාරකය වෙත පැමිණෙන ඕනෑම පුද්ගලයකුගේ සිත ශාන්ත ස්වභාවයෙන් යුතුව උතුම් යුග පුරුෂයන්ට ගෞරව දැක්වීමට සුදුසු මනසක් නිර්මාණය කරයි.

- රණවිරු පිළිරූ ත්‍රිත්වය දරා සිටින චතුරස්‍රයේ පැති හතරෙහි නිර්මාණය කර ඇති රූපවලින් පාසල් අවදියෙන් පසු තම මවගේ ආශිර්වාදය ලබාගෙන මාතෘ භූමියේ එක්සේසත් බව රැකීම උදෙසා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ආධුනික සෙබළෙකු වශයෙන් බැදී මූලික යුධ පුහුණුව ලබා එය අවසන් කර, අභීත සෙබළෙකු ලෙස දිවි පරදුවට තබා සතුරන් සමඟ සටන් වැද සතුරන් පරාජය කොට ජයග්‍රහණය ලබන රණවිරුවෙකු මගින් සිංහ විරුවන්ගේ නොපසුබට වීරත්වය විදහා දක්වයි.

- ගාම්භීර ලීලාවෙන් ස්මාරකයේ අවි අතදරා සිටින රණවිරු පිළිරූ තුනක් සතර දිශාවට මුහුණලා සිටින අයුරින් නිර්මාණය කර ඇති අතර, එයින් සිංහ විරුවන්ගේ තීක්ෂණ අවධානය හා සමස්ත භූමියම ආවරණය වන සේ තම වගකීම අභීතව සැමදා ඉටුකරන බව නිරූපණය කරයි.

- ස්මාරකයේ රණවිරු පිළිරූ ත්‍රිත්වය දරා සිටින චතුරස්‍රය දුඹුරු පැහැයෙන් යුතුව වර්ණාලේප කර ඇති අතර, එමගින් ස්ථිරභාවය, මිත්‍රශීලීත්වය, විශ්වාසනීයත්වය සහ මනා සෞඛ්‍ය නියෝජනය කරයි. නොසෙල්වී සිටිමින් විශ්වාසනීයත්වයේ ප්‍රවේශතාව මගින් තම මව්බිමේ සියලු ජන කොටස්වල අභ්‍යන්තර හා බාහිර ආරක්ෂාව වෙනුවෙන් සිංහ විරුවන් නිරන්තරයෙන් ඇපකැපව සිටින බවත් සිංහ රෙජිමේන්තුවේ ශක්තිය හා ජවසම්පන්න බව මෙමගින් නිරූපණය කරයි.



- තවද අනාගත දූ පුතුන් වෙනුවෙන් සාමකාමී නිවහල් දේශයක් උරුමකරදීමේ උදාරතර මෙහෙය වෙනුවෙන් තම තුරුණු දිවිය කැප කළ සිංහ රෙජිමේන්තුවට අයත් වීරෝදාර රණවිරුවන් 3864 දෙනෙකුගේ නම්, ඒකකය, මියගිය දිනය හා ස්ථානය සඳහන් කර නොමැකෙන අයුරින් ශිලාලේඛණ ගතකර ඇති පුවරු දෙකක් ස්මාරකයට පිටුපසින් ඉදිකර ඇත.

- ස්මාරකය අභියස පිත්තලින් නිම කරන ලද නෙළුම් මලක ආකෘතියෙන් යුක්ත වූ පහනක් නිර්මාණය කර ඇති අතර, ඉරබැස යන මොහොතේ විරුවන් සිහි කිරීමේදී බියුගල් නලා හඬත් සමඟ අලංකාරවත් පහන ප්‍රදීපනය කරනු ලබයි.

- ස්මාරකයට දකුණුපසින් හා වම්පසින් පිහිටි භූමියට තරමක් උස්කර ඉදිකරන ලද කවාකාර ගල්වැටි දෙකක් දක්නට ලැබෙන අතර, එය බියුගල් ස්ථම්භ වේ. ඒ මත නැගී බියුගල් නලාකරුවන් බියුගල් හඬ වා තලයට මුසුකරමින් මියගිය වීරෝදාර රණවිරුවන් සිහිපත් කරවයි.

- අවර අවි පුද කරමින් මියගිය වීරෝදාර රණවිරුවන් සිහිකිරීම සඳහා ස්මාරකය වටා සතර දිශාවට මුහුණලා චතුරස්‍රාකාර කොළපැහැති ස්ථාන හතරක් ඉදිකර ඇත.

මේ සියලු දේ කියාපාන්නේ ඉර හඳ පවතිනා තුරු මෙම රණවිරු ස්මාරකය පවතිනා බවයි.

*ඉදිරිපත් කිරීම - රෙජිමේන්තු මධ්‍යස්ථානය*
*ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව*

# නව ක්‍රීඩාගාරය විවෘත කරයි...

ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකා රෙජිමේන්තු මධ්‍යස්ථානයෙහි නවතමයෙන් ඉදිකරන ලද ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව ක්‍රීඩාගාරය විවෘත කිරීම ඉකුත් සැප්තැම්බර් 03 වන දින සිදුකෙරිණ. එම උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තිය වශයෙන් ලිලී කොබ්බෑකඩුව මහත්මිය සහභාගී වූවාය. ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් ඒඑල්පීඑස් තිලකරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ඇතුළු නිලධාරීන් ද විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද ඊට එක්වූහ.



# මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක්...

22 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් මූතූර් ප්‍රදේශයේ ආගමික පූජකවරුන්, ප්‍රජානායකයින් සහ මුස්ලිම් ප්‍රජාවේ වෘත්තිකයින් දැනුවත් කිරීමේ වැඩමුළුවක් ඉකුත් අගෝස්තු මස 12 වන දින මූතූර් නාධුවා අරාබි පාසලේදී පැවැත්විණ. මෙම වැඩමුළුවට 233 වන බලසේනාවේ බලසේනාධිපති, 15 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී, මුස්ලිම් දේවස්ථානවල සභාපතිවරු, ධීවර සමිතිවල සභාපතිවරු සහ මූතූර් ධීවර සංගමයේ සාමාජිකයින් ඇතුළු 100 දෙනෙකුට අධික පිරිසක් සහභාගී වූහ.



# සංහිඳියාවට අත්වැලක්...

15 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ හට පිරිස්වල ශ්‍රමදායකත්වයෙන් කෝප්පායි ප්‍රදේශයේ පදිංචි දමිළ ජනතාව සඳහා ඉදිකරන ලද නව සංහිඳියා මධ්‍යස්ථානය ඉකුත් සැප්තැම්බර් 25 වන දින යෙදුණු සුබ මොහොතින් විවෘත කෙරිණ. ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑච්එස් සෙනරත් බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ මගපෙන්වීම මත 511 වන පාබල බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති කර්නල් ටීඑම්ආර්බී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ පූර්ණ අධීක්ෂණයෙන් සිදුවූ මෙම මාහැඟි කටයුත්තට වාමදේව ත්‍යාගේන්ද්‍රන් මහතා මූල්‍ය දායකත්වය සපයන ලදී.



# සිතුවිලි සාගරය....

## විවාහයේ සත්වසක සැමරුම..

විටක නුඹ මට යෙහෙළියක් විය
විටක නුඹ මා පෙම්වතෙක් විය
විටක මටද නුඹ පෙම්වතියක් විය
පසුව අපි අපිට හැතුවම බැරි පෙම්වතුන් විය

දිනක නුඹ මගෙ මුලු ලොවම
අතහැර බාදක දහසක් මැදින්
මා වෙත පැමිණියෙමි
පැමිණ මග නුඹ ඒ සියලු බාධක
ජය ගනිමින් මගේ ජිවන සහකාරිය විය
එලෙස ජිවන සහකාරිය වී අදට
සත්වසරක කාලය ගෙවී ගොස් ඇත
ජිවිතය නොදුටු මා නුඹ මතින් ජිවිතය දුටිමි

දැන් මා දරු දෙදෙනෙකුගේ පියෙකි
මෙලොව මා දුටු සුන්දරම
සිහිනය සැබෑවී ඇත
මා තැනූ ඒ පුංචි කැදැල්ලේ රැජින නුඹ විය
එලෙස මා වෙනුවෙන් නුඹ
ඉටුකරන්නා වූ අමිල මෙහෙවර
ඇගයීමට වචන නොමැත
සදා රකිමි දරු පැටවු සමගින්
නුඹව පණමෙන් දිවි ඇතිතුරා...

සෙ/430237
කෝප්‍රල් සජිව කේපී
17 ගැහේබ

## අම්මා...

ගං දැල යා කරන්
ගලන මග දිය කඳන්
වාගෙයි නුඹ මටනම්
තත්පරෙන් තත්පරේ
දිය උණන උල්පතක්
වාගෙයි නුඹ...
දයාබර බව
දා ගසට පවන් පොදක් සේ
තිවූ අප දුක් සෝ තැවුල්
ඔබේ එක හිනාවක්
මට නවාතැන් පලක්
සසර ආවාද ඔබ
තියෙනවාද මතකයක්
උපනුපන් භවේ එන
මෙවැනි බැඳිමක්
අරන් ඔබ ආවේම
අපට වෙන් වූ ලෝකයක්
තුන් ලොවේ මට නොවේ
ඔබට වැඩියෙන් කෙනෙක්
අම්මේ...

23 පාඨමාලාව
සෙ/2019 විජය්ආර්ඩී 99527
ආකාසෙ තිලකරත්න ආර්චන්ජ්චම
5 (සේව) ශ්‍රිලයුකාබ
දළ්කාන

## හිටිය දැන් ඇති කොරෝනා..

කොරෝනා ආදර සින පාරලා
ඇත අද මුළු  ලොවක් හඬවලා
ආදර හදවත් දුකෙන් මුදාලා
යන්න කොරෝනා දැන් ඇති හිටියා

සිහින ගොඩක් මැව්වා ආදරය විදින්නට
දින සති ගෙවුණා අපි තව දුර ඈතක
කවදා ලංවී ආදරය විදින්නද
ඔබ ඈතයි මගේ උණුසුම ළග අද

ආසයි දකින්න මගෙ සෙවනැලි ළග
නමුත් ඉඩක් නැත ඇත ලොව සසලව
කුමක් කරන්නද හංගන්නට මිස
ඉන්නෙමි එනතුරු ඔබ මගෙ තුරුලට

සෙ/286445
ලා/කෝප්‍රල් ජයනාත් ඩබ්ලිව්ආර්බී
6 ශ්‍රීලංසංබ

## විශ්වාසය..

විශ්වාසය බිඳදාමූ කිසිවකුත්
නැවත නැවත
තම ජිවිතයට ලංකර නොගන්න
මන්ද...
එය ඔබේ විනාශය වන්නට
ඉඩ ඇත...

සෙ/278465
කෝප්‍රල් ලලිත් කුමාර එම්පීඑස්
1 ශ්‍රීලංසංබ

## කාලයේ වටිනාකම ඔබ දන්නවාද..

අවුරුද්දක වටිනාකම දැනගැනීමට
විභාගය අසමත් වූ සිසුවෙකුගෙන් අසන්න...

මාසයක වටිනාකම දැනගැනීමට
නොමේරූ දරුවෙකු ලද දෙමාපියන්ගෙන් අසන්න...

සතියක වටිනාකම දැනගැනීමට
සතිඅන්ත පුවත්පතක කතුවරයෙකුගෙන් අසන්න...

දවසක වටිනාකම දැනගැනීමට
දවස් පඩියට වැඩ කරන සේවකයෙකුගෙන් අසන්න...

පැයක වටිනාකම දැනගැනීමට
හමුවීමට පෙරුම් පුරන ආදරවන්තයින්ගෙන් අසන්න...

මිනිත්තුවක වටිනාකම දැනගැනීමට
කෝච්චියක හෝ බසය වැරදුනු කෙනෙකුගෙන් අසන්න...

තත්පරයක වටිනාකම දැනගැනීමට
අනතුරකින් ගැලවුන කෙනෙකුගෙන් අසන්න...

මිලි තත්පරයක වටිනාකම දැනගැනීමට
ඔලිම්පික් රිදී පදක්කම් ලාභියෙකුගෙන් අසන්න...

සෙ/ 319986 ඔනි I ඕඑච්ටීපී මහින්ද කුමාර
විදේශීය මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය
කොළඹ

## උප්පන්න නිලධාරී..

රස මසවුළු ඇතත්
වෙලාවට කන්න නැති...
දහසකුත් වැඩ ඇතත්
කරන්නට කෙනෙකු නැති...
අඹු දරුවන් ඇති හමුදු
ගමට යනු වරම් නැති...
පඩි පතට නොවැඩි මුත්
වියදමත් වැඩිව ඇති...
එනමුදු අපි සැම
සතුටින් සිටින්නෙමු...

ඩීඑම්ඩී නයනජිත් විජේරත්න
ශ්‍රී රතනපාල නාහිමි මාවත,
තඹගල්ල.

## බලාපොරොත්තුව..

ඇතුගල කන්ද වගේ
මං නුඹව දරාගෙන උන්නා...
නුඹ මහ වැස්ස වගේ
දුකම අරගෙන කඩන් වැටුණා...

ප්‍රතික්ෂේප ප්‍රේමයක් ලග
හඬා වැටෙන්නට නොහැකි හින්දා...
අදත් තනියම බලාගෙන ඉමි
මහමෙරක් වූ බර දරා...

හීන හත්ගව්වක් එහා ගොස්
කුරුළු ඇස් ළග නැවතුනා...
උපදිනා හැම සසර භවයෙම
නුඹේ වෙන්නට බලන් උන්නා...

සෙ/59424
ඔනි 1 කේඑස්සීපී කැන්දවල
1 ශ්‍රීලයුකාබ

# වෘත්තීය දිවියේ අනේකවිධ සුබ මොහොතින් නව තනතුරු ලැබූ රැකවරණය ලැබේවායි "රණවිරුවා" ද



ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ
රෙජිමේන්තු අධිපති ලෙස
මේජර් ජෙනරාල්
පීජේ ගමගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
යූඑස්පී එන්ඩීසී
2020 සැප්තැම්බර් මස 29 දින සිට



විධායක ජෙනරාල් ශාඛාවේ
විධායක ජෙනරාල් ලෙස
මේජර් ජෙනරාල්
එස්එස් වඩුගේ ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී
2020 සැප්තැම්බර් මස 03 දින සිට



61 වන සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
මේජර් ජෙනරාල්
ඩබ්ලිව්ඩබ්ලිව්එච්එස් වනසිංහ ආර්එස්පී
යූඑස්පී එන්ඩියූ
2020 සැප්තැම්බර් මස 15 දින සිට



53 වන සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
බ්‍රිගේඩියර්
එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී
2020 සැප්තැම්බර් මස 15 දින සිට



ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ
බළකායේ මධ්‍යස්ථාන
සේනාවිධායක ලෙස
බ්‍රිගේඩියර්
ජේපීඑච් ගමගේ යූඑස්පී ඒඩීටීඩී
2020 සැප්තැම්බර් මස 03 දින සිට



52 වන සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
බ්‍රිගේඩියර්
කේ ලියනගේ
ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී එන්ඩියූ
2020 සැප්තැම්බර්
මස 03 දින සිට



611 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස
බ්‍රිගේඩියර්
එල්ඊජේඑල්බී උඩෝවිට
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
2020 සැප්තැම්බර් මස 04 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය
(වන්නි) කර්නල් ප්‍රධාන මාණ්ඩලික
නිලධාරී ලෙස
කර්නල්
කේඑම්ඩී කොඩිතුවක්කු
2020 සැප්තැම්බර් මස 30 දින
සිට



ස්වේච්ඡා පුහුණු පාසල (දියතලාව)
සේනාවිධායක ලෙස
කර්නල්
එච්ඩී කීර්තිනාථ ආර්එස්පී පීඑස්සී
2020 සැප්තැම්බර් මස 12 දින සිට



ආරක්ෂක සේනා
මූලස්ථානය
(කිලිනොච්චිය) සිවිල්
සම්බන්ධීකරණ
නිලධාරී ලෙස
ලුතිනන් කර්නල්
එච්ඩබ්ලිව්ජේඑම්
නවරත්න
2020 සැප්තැම්බර්
මස 03 දින සිට



5(සෙවී) යාන්ත්‍රික පාබල
රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී
ලෙස
මේජර්
ඊආර්ඒ සිල්වා
2020 සැප්තැම්බර් මස 10 දින
සිට



11 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක
බළමුළුවේ
අණදෙන නිලධාරී ලෙස
මේජර්
ඩබ්ලිව්පීඑන්ඩී වීරසිංහ
2020 අගෝස්තු මස 24 දින සිට

**කඩඉම් පසුකොට**
**ඔබ සියලු දෙනාට දිරිය, විරිය,**
**මෙසේ සුබ පැතුම් එක්කරයි.**

ආරක්ෂක සේනා (බටහිර)
ආඥාපති ලෙස
මේජර් ජෙනරාල්
බීවීඩීපී අබේනායක යූඑස්පී එන්ඩියූ
2020 සැප්තැම්බර් මස 03 දින සිට



උපකරණ මාස්ටර් ජෙනරාල්
ශාඛාවේ උපකරණ මාස්ටර්
ජෙනරාල් ලෙස
මේජර් ජෙනරාල්
ඒඑස් හේවාවිතාරණ ආර්එස්පී
යූඑස්පී එන්ඩීසී අයිජී
2020 සැප්තැම්බර් මස 29 දින සිට



64 වන සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
බ්‍රිගේඩියර්
ඒපී පල්ලාවල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
2020 සැප්තැම්බර් මස 15 දින සිට



11 වන සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
බ්‍රිගේඩියර්
එස්එම්එස්පීබී සමරකෝන්
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
2020 සැප්තැම්බර් මස 03 දින සිට



65 වන සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
බ්‍රිගේඩියර්
ඩීඑම්ටී දිසානායක
ආර්එස්පී යූඑස්පී
2020 සැප්තැම්බර්
මස 09 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය
(නැගෙනහිර)
බ්‍රිගේඩියර් පාලන/භාණ්ඩාගාර ලෙස
බ්‍රිගේඩියර්
එස්එච්ඒ දිසානායක ඒටීඞී
2020 සැප්තැම්බර් මස 07 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය
(මධ්‍යම)
බ්‍රිගේඩියර් පාලන/භාණ්ඩාගාර ලෙස
බ්‍රිගේඩියර්
ටීඑම්පීපීඑස් තෙන්නකෝන්
ආර්ඩබ්ලිව්පී
2020 සැප්තැම්බර් මස 30 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය
(නැගෙනහිර) කර්නල්
සම්බන්ධීකරණ නිලධාරී ලෙස
කර්නල්
එස්අයිපී විදානගමගේ ආර්එස්පී
2020 සැප්තැම්බර් මස 07 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය
(කිලිනොච්චිය) කර්නල්
සම්බන්ධීකරණ නිලධාරී ලෙස
කර්නල්
ඩීඑල්ඩීඩී ජයසූරිය
2020 සැප්තැම්බර් මස 18 දින සිට



ආරක්ෂක සේනා
මූලස්ථානය
(මුලතිව්) ප්‍රධාන
සිවිල් සම්බන්ධීකරණ
නිලධාරී ලෙස
ලුතිනන් කර්නල්
ඩීපීඩබ්ලිව් ද සිල්වා
2020 සැප්තැම්බර්
මස 08 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය
(වන්නි) ප්‍රධාන සිවිල් සම්බන්ධීකරණ
නිලධාරී ලෙස
ලුතිනන් කර්නල්
ඩීබීආර්ඩබ්ලිව්එම්එම්ඩබ්ලිව්එච්කේ
මඩුගල්ල
2020 සැප්තැම්බර් මස 10 දින සිට



16 වන ශ්‍රී ලංකා සිංහ
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස
මේජර්
කේආර් පෙරේරා ආර්එස්පී
2020 සැප්තැම්බර් මස 08 දින සිට



## දහයෙ කාසිය...

**කසුන්** - මචං... අද මට පාරෙ වැටිල තිබිල රුපියල් දහයක් හම්බවුණා බං...

**සමීර** - ඒ දහයෙ කාසිය මගෙ බං... කෝ ඒක...?

**කසුන්** - ඒත් මට හම්බුණේ රුපියල් පහේ කාසි දෙකක්නෙ...

**සමීර** - බිමට වැටෙනකොට දෙකට කැඩෙන්න ඇති බං...

## සුරංගනාවී...

**සුපුන්** - අම්මේ... ඇයි නංගී සුරංගනාවියක් කියල මට බොරු කිව්වෙ...?

**අම්මා** - බොරු නෙමෙයි පුතේ..

**සුපුන්** - එහෙනම් ඇයි මම නංගිව උඩ තට්ටුවෙන් පහළට තල්ලු කරනකොට එයා පියාඹුවෙ නැත්තේ...



## මූසලකම...

**තාත්තා** - බලපං... අර අල්ලපු ගෙදර කෙල්ල විභාගෙ ඉහළින්ම පාස්.... කොච්චර වාසනාවන්තද ඒ කෙල්ල...

**සුගත්** - ඕකිගෙ ඇති වාසනාවන්ත කමක් නෑ තාත්තෙ... ඔය කෙල්ල හද්ද මූසලයි...

**චමීර** - ඒ මොකද බං ඒ...

**සුගත්** - විභාගෙ ලියනකොට ඔය කෙල්ල දිහා බලන් ඉඳලනෙ මම විභාගෙ ෆේල් වුණේ...

## ෆිල්ම් බැලීම...

**රන්සිත** - බබා... අපි හෙට ෆිල්ම් එකක් බලන්න යනවා... මම ඔයාලගෙ ගෙවල් ගාවට ඇවිත් හෝන් එකක් ගහන්නම්... එනකොට එන්ඩ...

**ලංකානි** - හා බබා... ශා මරුනෙ... ඔයා වාහනයක් ගත්තද...?

**රන්සිත** - නෑ බබා... මම අලුත් හෝන් එකක් ගත්තා...

## රහ කෑම...


**සඳුනි** - වේටර්... මෙහෙ එනවා...

**වේටර්** - ඇයි මිස් මොකක්ද වෙන්න ඕනි...?

**සඳුනි** - බලනවා... මේ කෑම කන්න පුළුවන්ද කියල... නෝ මේ හෝටලේ මැනේජර්...?

**වේටර්** - කෑමට එළියට ගිහින් මිස්...






බිහන්සා
සෙනිති
මිනුලි
සෙහස්
දෙවිනිත්
සිත්මි
සෙනුලි
තිසුමි
දිනෙත්මා
විරනි
සෙතුමිසා
හිරු තරු සේ දිලෙන විරු දරු සැමරුම්
මල් කැකුළු වන් රණවිරු දුවා දරුවන්ට සුව සැපත, ජය සතුට පිරි
වාසනාවන්ත උපන් දිනයකට "රණවිරුවා" මෙලෙස සුබ පැතුම් එක්කරයි.




# චෙස් තරඟාවලියෙන් ජය ලබා...

9 වන වෙළඳ හා රාජ්‍ය සේවා ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ චෙස් තරඟාවලිය ඉකුත් අගෝස්තු 29 වන දින සිට සැප්තැම්බර් 01 වන දින දක්වා මහරගම සතර දේගත ශාලාවේදී පවත්වන ලදී. එම තරඟාවලිය සඳහා සහභාගී වූ යුද්ධ හමුදා චෙස් කණ්ඩායම සමස්ත කණ්ඩායම් 12 ක් අතුරින් අනුශූරතාවය දිනාගැනීමට සමත්වූහ. තවද තරඟාවලියේ තේවල තරඟ රැසක ජයග්‍රහණ ද අත්පත් කරගනිමින් ඔවුන් දැක්වූ දක්ෂතාවය හරහා යුද්ධ හමුදාවට මහත් කීර්තියක් අත්කර දීමට සමත්විය.

---


## රණවිරුවා

**පරිගණක අකුරු සංයෝජනය, තවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 මා/සැරයන් සේනාරත්න
ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ
එම්ජීජ්එම් - 11 ඉසේරෙ
සෙ/754676 ලාන්ස් කෝප්‍රල්
ලක්තිලිණ ඩබ්ලිව්ආර් - 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුධ දිගුව**

51445/51446

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම්
අධ්‍යක්ෂ මණ්ඩලය






**අධීක්ෂණය**

බ්‍රිගේඩියර් එච්පී සරණාරත්න අයිපී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල් ඩීඑම්එම් දිසානායක ආර්ඩබ්ලිව්පී



**ප්‍රධාන සංස්කාරක**

මේජර් සුජිත් වජිරඥ ඒදිරිසිංහ ශ්‍රීලසුපාබාසේ



**සෝදුපත් කියවීම**

මේජර් සී ජයවීර - ශ්‍රීලපාය



**සහාය සංස්කාරක**

කපිතාන් ආර්ඩී හේවාවිතාරණ - ශ්‍රීලකාබ












# 2020 යුද්ධ හමුදා මාර්ග ධාවන තරඟාවලිය

2020 යුද්ධ හමුදා මාර්ග ධාවන තරඟාවලියේ සමාරම්භය මෙවර ඉතා නැවුම් මුහුණුවරකින් යුක්තව යුද්ධ හමුදා මූලස්ථානය අභියසදී ඉකුත් සැප්තැම්බර් 26 වන දින ඉතා උත්කර්ෂවත් අයුරින් පැවැත්විණ. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති සහ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය. මෙම තරඟාවලිය වෙනුවෙන් මෙවර යුද්ධ හමුදාවේ රෙජිමේන්තු 17 ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 125 දෙනෙකු සහභාගී වූ අතර, එය කිලෝමීටර් 22 ක ධාවන දුරකින් සමන්විත විය. මෙම මැරතන් ධාවන තරඟයේ සංවිධාන කටයුතු ශ්‍රී ලංකා යුද්ධ හමුදා මළල ක්‍රීඩා සභාපති හා ක්‍රියාන්විත අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ මූලිකත්වයෙන් හා උපදෙස් මත සිදුවිය. මෙවර මෙම තරඟාවලිය සඳහා කාන්තා ක්‍රීඩිකාවෝ 15 දෙනෙකු ද සහභාගී වූහ.

# නො වැරදුණු කුරුමානම...

කුරුමානම වැරදුනොත් කොයිතරම් අත්‍යාවශ්‍ය ඉලක්කයක් උනත් මගහැරෙන්න පුලුවන්. ඒ වගේමයි එහෙම මගහැරුණු ඉලක්ක නැවත අපට මුණනොගැහෙන්නත් පුළුවන්. ඒ හින්ද ලැබුණු පළමු අවස්ථාවේදීම නිවැරදිව කුරුමානම අල්ලල හරියටම ඉලක්කය ජයගන්න ඕනෙ. ගෙවුණු තිස්වසක කාලපරිච්ඡේදයේදී හමුදාවෙ අපි රට වෙනුවෙන් ගත්ත ඉලක්ක කවදාවත් වැරදුණේ නැහැ. අද ජනතාව අත්විඳින සාමය හා නිදහස එහි ප්‍රතිඵලයක්. ඒත් අපි ගත්ත කුරුමානම වෙනස්කරන්න, මගහරවන්න, එවක විවිධ බලවේග උත්සාහ දැරුව බවත් අමතක කරන්න එපා.



රණබිමේ මතක



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.